# Economic Structure and Economic Policies of Sri Lanka

# ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති

## General Certificate of Education (Advanced Level)

## 2020 October

# පටුන

12.1. නිදහසින් පසු ශ්‍රී ලංකා අර්ථිකයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ විමර්ශනය....1
12.1.1 නිදහසින් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම්....1
1948 - 1960 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම් ....2
1961 - 1977 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම් ....3
1977 - 1994 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම් ....5
1994 - 2015 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම් ....7
2015 සිට මේ දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම් ....10
12.1.2 ආනයන ආදේශන කාර්මීකරණය; මූලික ලක්ෂණ....11
12.1.3 කාර්මීකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ....12
12.2.4 ආනයන ආදේශන ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය....12
12.1.5 කාර්මීකරණ ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය ....13
12.1.6 අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය අර්ථකථනය ....13
12.2. ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා පිළිබඳ ගවේෂණය ....17
12.2.1. නිෂ්පාදනය හා එහි සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්....18
12.2.3. යටිතල පහසුකම් සංවර්ධනය....26
12.2.4 සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා විශ්ලේෂණය ....30
12.2.5. **ප්‍රාදේශීය සංවර්ධනය** ....30
12.3 සමකාලීන ආර්ථික සිදුවීම් සහ ප්‍රතිපත්ති....32
12.3.1. මෑතකාලීන වශයෙන් සිදු වූ දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම් ....**33**
12.3.2. දේශීය හා ගෝලීය සිදුවීම් මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට කරන ලද බලපෑම ....34
12.3.3.දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම් කෙරෙහි බලපාන සාධක ....35
12.3.4. සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති ....36


# 12.1. නිදහසින් පසු ශ්‍රී ලංකා අර්ථිකයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ විමර්ශණය

## 12.1.1 නිදහසින් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම්


මේ යටතේ පහත සඳහන් කාලසීමාවන් තුල සිදු වූ අර්ථිකමය සහ ප්‍රත්පත්තිමය කරුණු පිළිබඳ විග්‍රහ කරුණු ලැබේ

- 1948 -1960
- 1961-1977
- 1977-1994
- 1994-2015
- 2015 සිට මේ දක්වා









## 1948 - 1960 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම්

1948-1960 කාලය තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය රාජ්‍ය පාලන අවධි කිහිපයක් යටතේ පාලනය විය.






1948-1951 → ඩී. එස්. සේනානායක
1952-1953 → ඩඩ්ලි සේනානායක
1954-1955 → සර් ජෝන් කොතලාවල
1956-1959 → එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරණායක

**මෙම සමයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ පහත ලක්ෂණ දැකිය හැකිවිය.**

### 1. යටත් විජිත යුගයේ දී පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිතව ක්‍රියාත්මක වීම.

- නිදහස ලබනවිට කලාපයේ අනෙකුත් රටවල් වලට සාපේක්ෂව ඉහළ සමෘද්ධිමත් රටක්ව පැවති බැවින් බ්‍රිතාන්‍ය යටත් විජිත ආර්ථික ප්‍රතිපත්ති සුවිශේෂී වෙනසකට භාජනය නොකර පවත්වාගෙන යාම.

### 2. ලෝක බැංකුවේ බලපෑම් ප්‍රථම වතාවට ශ්‍රී ලංකා ආර්ථිකය මත පතිත වීම.

- මෙරටට පැමිණි ලෝක බැංකු නියෝජිතයන්ගේ නිර්දේශය වූයේ ශ්‍රී ලංකාව වැනි රටක් කෘෂිකර්මාන්තය මත පදනම් වියයුතු බව යි.
- 1951-1953 කාලය තුළ ඇතිවූ කොරියානු යුධමය තත්ත්වය හේතුවෙන් තේ සහ රබර් සඳහා ලෝක වෙළෙඳපොළේ ඉහළ මිලක් නියමවීම තුළින් වැඩි විදේශ විනිමයක් උපයාගත හැකිය යන උපකල්පනය මත ශ්‍රී ලංකා පාලකයින් කාර්මීකරණයට නැඹුරු නොවීම.

### 3. ආර්ථික සංවර්ධනයේ උපායමාර්ගයක් ලෙස කෘෂිකර්මාන්තයට ප්‍රබල තැනක් ලබාදීම.

- තේ, පොල්, රබර් ආශ්‍රිත වාණිජ වගාවන් දියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමුකිරීම.

### 4. යැපුම් කර්මාන්තය නඟාසිටුවීමට පියවර ගැනීම.

- යටත් විජිත යුගයේ දී නොසලකා හැර තිබූ දේශීය යැපුම් කර්මාන්තය යළි නඟාසිටුවීම.

### 5. ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇතිවීම.

- වගාකරන බිම් ප්‍රමාණය වැඩිකිරීමටත්, වගා ඉඩම්වල ඵලදාව ඉහළ නංවාගැනීමටත් ප්‍රමුඛතාව ලබාදීම.
- වියළි කලාපයේ ඉඩම් හා වාරිමාර්ග සංවර්ධනය තුළින් තෙත් කලාපයේ අතිරික්ත ජනගහනය වියළි කලාපයේ පදිංචි කිරීම.
- ඉඩම් නොමැති සුළු ගොවීන්ට ඉඩම් ලබාදීම.
- බිඳීගිය වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම.
- ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වන "ගල් ඔය" ව්‍යාපාරය මෙම අවධියේ දී ක්‍රියාත්මක කිරීම.

### 6. ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම.

- ගෙවුම් ශේෂයේ අහිතකර තත්ත්වයක් මත විදේශ විනිමය සංචිත ද සීඝ්‍රයෙන් අඩුවිය.

### 7. ප්‍රතිශීර්ෂ ආදායමේ වර්ධනය මන්දගාමී වීම.

- 1951-1956 කාලය තුළ ආර්ථික වර්ධන අනුපාතය වසරකට 3.6% ක අගයක් පෙන්නුම් කළ ද ජනගහනය වාර්ෂිකව 2.7% කින් වර්ධනය විය.

### 8. රාජ්‍ය ආයෝජනයන් පහළ මට්ටමක පැවතීම.

- යටත් විජිත යුගයේ දී ආරම්භ වුණු සුභසාධන වියදම් එලෙසම පවත්වාගෙන ගිය අතර රජයේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් සුභසාධන වියදම් සඳහා වෙන්කිරීම.

### 9. පුළුල් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 10. පෞද්ගලික අංශයේ වත්කම් ජනසතු කිරීම.

- 1957 දී බස් සේවාව
- 1958 දී වරාය බඩු පැටවීම සහ බෑම ආශ්‍රිත කටයුතු

## 1961-1977 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම්

සිරිමාවෝ බණ්ඩාරනායක (1960-1965)



→ ඩඩ්ලි සේනානායක (1965-1970)



සිරිමාවෝ බණ්ඩාරනායක (1970-1977)



### 1960-1965

- 1960 දී ශ්‍රී ලංකාව තුල පවතින අයහපත් වෙළෙඳ ගිණුමට සහ විදේශ වත්කම් ඉතා දරුණු ලෙස පහළ වැටීමේ කරුණු මූලික ලෙස ඉලක්ක කොට ගෙන දැඩි ආනයන සීමාවන් හඳුන්වා දෙන ලදී.
- ආනයන පාලනය කරමින් දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම මෙහිලා ප්‍රධාන කාර්යභාර්යය විය.
- වර්ධනය වෙමින් පැවති ගෙවුම් ශේෂ අර්බුද සමනය කිරීම සඳහා ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වා දීමට පියවර ගන්නා ලදී.
  - සැහැල්ලු කර්මාන්ත (උදා: ඇඟළුම්) ආරම්භ කිරීමට පෞද්ගලික ව්‍යවසායකයින් දිරිමත් කරමින් මහා පරිමාණ කර්මාන්ත (උදා:සීනි, සිමෙන්ති) රාජ්‍ය අංශයේ මැදිහත් වීම මගින් ග්‍රාමීය ප්‍රදේශ වල ස්ථාපනය කරන ලදී.

- පෞද්ගලික අංශයේ වත්කම් ජනසතු කිරීම මෙම අවධියෙහි දක්නට ලැබුනු ප්‍රධාන ප්‍රතිපත්තියකි.
    - උදා: 1962 දී රක්ෂණ සමාගම් සහ ඛනිජ තෙල් බෙදා හැරීම ජනසතු කරන ලදී.
- නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය හා ආර්ථික ගුණාත්මකභාවය වර්ධනය කෙරෙහි අවධානය යොමු විය.
- දේශීය කෘෂිකාර්මික අංශයෙහි සංවර්ධනය උදෙසා විවිධ ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරන ලදි.
    - උපදේශන සේවා
    - පොහොර සහනධාර
    - නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම
    - වියළි කලාපයේ ගොවීන් නැවත පදිංචි කරවීම
    - වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය
    - කෘෂිකාර්මික පර්යේෂණ ආයතන පිහිටුවීම(උදා:ගන්නෝරුව කෘෂිකාර්මික පර්යේෂණ ආයතනය)

## 1965-1970


- විදේශ වෙළෙඳාම සහ විනිමය මත පනවා තිබූ දැඩි පාලනයන් තරමක් ලිහිල් කරමින් අපනයනාභිමුඛ කාර්මික ප්‍රතිපත්තියක් සහිත නිර්බාධ ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී.
- 1967 දී රුපියල අවප්‍රමාණය කොට ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
- පෞද්ගලික අංශය දිරිමත් කරමින් සක්‍රීය කාර්යභාර්යයක් පෞද්ගලික අංශයට පැවරීමට කටයුතු කිරීම මෙම ප්‍රතිපත්ති මාලාවෙහි ප්‍රධාන කරුණක් විය.
- නිෂ්පාදනය හා බෙදා හැරීම කෙරෙහි මිල හා වෙළෙඳපොළ යාන්ත්‍රණය යොදා ගැනුණි.
- අලුතින් රාජ්‍ය ව්‍යපාර ආරම්භ කිරීමෙන් වැළකී, යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි මූලිකත්වය ලබා දෙමින් රාජ්‍ය වියදම් කටයුතු කරන ලදී.
- ලොව පුරා ක්‍රියාත්මක වූ "***හරිත විප්ලවය***" පාදක කරගනිමින් දේශීය කෘෂි කර්මාන්තය සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී.
    - ඉහළ ඵලදායීතාවයක් ලබා දෙන බීජ හඳුන්වා දීම
    - රසායනික පොහොර සහ වෙනත් කෘෂි රසායන භාවිතය
    - ට්‍රැක්ටර් සහ වෙනත් ගොවිපොළ යන්ත්‍ර හඳුන්වා දීම
    - ව්‍යාප්ති සේවා පුළුල් කිරීම
    - කෘෂිකාර්මික ණය ක්‍රම හඳුන්වා දීම

## 1970-1977

- ආවෘත ආර්ථික ප්‍රතිපත්තිය පාදක කරගනිමින් ඇතැම් භාණ්ඩ ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කරමින් ඉන්ධන හා අත්‍යවශ්‍ය ඖෂධ හැර අනෙකුත් සියලුම ආනයන දැඩි ලෙස පාලනයට ලක් කර නැවතත් දැඩි ආනයන සීමාවන් පනවන ලදී.
- ආදායම් විශමතා අවම කිරීම පිණිස ආදායම් හා ධන සීමා පැනවීම.
- ආහාර සහනධාර සලාක ක්‍රම මගින් ලබා දීම, නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය ජනතාව වෙත ලබා දීම හරහා ශුභ සාධන කටයුතු පුළුල් කරන ලදී.
- සමාජවාදී ශ්‍රී ලංකාවක් බිහි කිරීම මෙම රජයේ මූලික අරමුණක් විය.

- ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය සමාජවාදී අංග ලක්ෂණ වලින් සමන්විත විය.
- රාජ්‍ය අංශය ව්‍යාප්ත කිරීමේ ප්‍රධාන අංග වූයේ ජනසතු කිරීම සහ රාජ්‍ය සංස්ථා පිහිටුවීමයි.
  - උදා:1970 දී මිනිරන් පතල් ද, 1972 දී වතු ද ජනසතු කිරීම
- ජනසතු කෙරෙණු වතු පරිපාලනය සඳහා, රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන දැවැන්ත රාජ්‍ය සංස්ථා දෙක පිහිටු වීම.
- 1973 දී අලුත් රාජ්‍ය සංස්ථා දහයක් ඇති කරන ලදී.
- 1971 දී නීතිගත කරන ලද "***ව්‍යපාර අත්පත් කර ගැනීමේ පනත***" යටතේ 1971-1976 කාලය තුල පෞද්ගලික ව්‍යපාර 24 ක් රජයට පවරා ගන්නා ලදී.
- සේවකයින් 100 ට වැඩි ඕනෑම පෞද්ගලික ව්‍යපාරයක් රජයට පවරා ගැනීමේ බලතල ආණ්ඩුව සතු විය.
- 1974 මැයි මාසයේදී රජය කුඩා ඉඩම් සඳහා "***පොල් පුනුරුත්ථාපන සහනාධාර ක්‍රමය***" හඳුන්වා දීම මගින් අක්කර 20 ට අඩු වතු හිමියන්ට ඔවුනගේ දේපළ සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.
- සුළු අපනයන භෝග සඳහා අවම පොළී අනුපාත ණය සහ සහනාධාර ලබා දීමේ අරමුණු මූලික කොට ගෙන අපනයනය විවිධාංගීකරණය කිරීම සඳහා "***සුළු අපනයන බෝග ආධාර යෝජනා ක්‍රමය***" හඳුන්වා දෙන ලදී.
- මැණික් කර්මාන්තය සහ මැණික් අපනයන වෙළදාම ප්‍රවර්ධනය කිරීම උදෙසා "***රාජ්‍ය මැණික් සංස්ථාව***" 1971 නොවැම්බර් මස ආරම්භ කරන ලදී.

## 1977 - 1994 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම්

- 1977-1989 → ජේ. ආර්. ජයවර්ධන
- 1989-1993 → රණසිංහ ප්‍රේමදාස
- 1993-1994 → ඩී. බී. විජේතුංග

1977 සිට 1994 දක්වා කාලය තුළ දක්ෂිණාංශික ස්වරූපයක් ගත් දේශපාලන නායකත්වයක් රටෙහි ක්‍රියාත්මක විය. මෙම කාලසීමාවේ වෙළඳපල කේන්ද්‍ර කරගත් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදී. තවද ආර්ථික කටයුතු වලට රජයේ මැදිහත්වීම අවම කර ආර්ථික කටයුතු සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කරන ලදී.

❖ **මෙම කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තුළ පහත දැක්වෙන වෙනස්කම් සිදුවිය.**

- **වෙළඳාම සඳහා තිබූ බාධා ඉවත් කිරීම**.
  - 1977ට පෙර දේශීය හා විදේශීය වෙළෙඳාම සඳහා පැවති බාධා ඉවත් කර මිල යාන්ත්‍රණය හඳුන්වා දෙන ලදී.

- **විනිමය පාලනයන් ඉවත් කිරීම**.
  - 1977නොවැම්බර් මස දී විනිමය අනුපාතිකය 46% කින් අවප්‍රමාණය කර, මහ බැංකුව විසින් තීරණය කරන ලද සීමාවන් තුළ පාවීමට ඉඩ හරින ලදී.

- **පෞද්ගලික අංශය කේන්ද්‍රකරගත් ආර්ථික වර්ධනයක් කරා යොමු වීම**.
  - 1977 සිට 1989 දක්වා කාලයේ දී ආර්ථික ලිහිල්කරණයේ පළමු රැල්ලත්, 1989 සිට 1993 දක්වා කාලය තුළ දී එහි දෙවන රැල්ලත් ක්‍රියාත්මක විය.
  - මෙහි අරමුණ වූයේ රජයේ දැඩි පාලනයෙන් නිදහස් වූ විවෘත ආර්ථිකයක් ගොඩනැගීම යි.
  - මේ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ අනුග්‍රහය ලැබුණි.
  - මේ යටතේ රජය පහසුකම් සලසන්නෙකු ලෙස පමණක් ක්‍රියාත්මක වී පෞද්ගලික අංශයට අවශ්‍ය පහසුකම් හා ආර්ථික නිදහස ලබාදීමට කටයුතු කරන ලදී.

- **ආයෝජන ප්‍රතිපත්ති**
  - ඍජු විදේශ ආයෝජන ප්‍රතිපත්තියේ වඩාත් වැදගත් අංශය වූ "**අපනයන සැකසුම් කලාප**" පිහිටුවීමේ බලතල සහිතව 1978 දී මහ කොළඹ අර්ථික කොමිසම පිහිටුවීම.
  - ප්‍රධාන ආයෝජන රටවල් සමඟ ආයෝජන ආරක්ෂණ ගිවිසුම් සහ ද්විත්ව බදුකරණ ගිවිසුම් වලට එළැඹීම.

- **පෞද්ගලීකරණ ප්‍රතිපත්ති**
  - අකාර්යක්ෂම සහ පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කරන ලදී.

**මෙම සමයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ පහත ලක්ෂණ දැකිය හැකිවිය.**

- අපනයන අභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වය
- ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇතිවීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය ඉවත් කොට පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- විනිමය පාලනය හා ආනයන පාලනය ඉවත් කිරීම
- පාලන ප්‍රතිපත්ති ඉවත් කොට ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම
- ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරීම
- ආර්ථිකය විවෘත කිරීම
- ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
- පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහකරණය වැනි සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

## 1994-2015 දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම්



චන්ද්‍රිකා බණ්ඩාරනායක
(1994-2005 )



මහින්ද රාජපක්ෂ
(2005-2015)

මෙම පාලන අවධියේ වාමාංශික දේශපාලනික ව්‍යුහයක් පැවති අතර ඔවුන්ගේ අභිමතය වූයේ දිළිඳුකම තුරන් කිරීමයි.ඒ සඳහා තම ආර්ථික ප්‍රතිපත්ති හැසිර වීමට ඔවුන් කටයුතු කරන ලදී. ඔවුන් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පහත දැක්වේ.

- 1994-2000 කාලච්ඡේදයේදී අපනයන ඉපැයුම් සඳහා රෙදිපිළි වලින් ද ඇගළුම් වලින් ද ලැබුනු දායකත්වය සැලකිය යුතු ආකාරයට ඉහළ ගියේය. රෙදිපිළි හා ඇගළුම් අපනයන ඉපැයීම් වල වර්ධනයේ සාමාන්‍යය එකී කාලච්ඡේදයේ 8.5% තරම් විය.
- කර්මාන්ත අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා 1996 ඵලදායීතා වර්ෂය ලෙසත් 1997-2006 ඵලදායීතා දශකය ලෙසත් ප්‍රකාශයට පත් කෙරුණි.
- දේශීය කෘෂි අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා මෙම අවධියේදී විශේෂ අවධානයක් යොමු කෙරුණි. එහිදී වැඩි අවධානයක් යොමු වූයේ වී නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහිය. ඒ සඳහා පොහොර සහනාධාර 1994 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කෙරුණි.
- දිළිඳුකම පිටු දැකීම සඳහා "ජන සවිය" නමින් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාවට නැංවූ අතර එමගින් දිළිඳු ජනතාවට සංවර්ධන කටයුතු සඳහා සහභාගී කර ගැනීමේ අවශ්‍යතාවය පළමු වරට පිළිගැනුණි.
- 1994 දී ඇති වූ දේශපාලන වෙනස්කම් වලින් අනතුරුව ජන සවිය වෙනුවට "**සමෘද්ධි**" නමින් වැඩසටහනක් 1995 දී හඳුන්වා දෙන ලදී.
- ආරම්භක අවධියේ සමාජයේ නිරපේක්ෂ දරිද්‍රතාව ක්‍රමයෙන් අඩු වුවද පසුව ලත් අත්දැකීම් වූයේ එම ප්‍රතිපත්තිය රටේ වඩා දුබල හා ආන්තික කොටස් මත කෙරෙන බලපෑම අයහපත් බවය. (දිළින්දන්ට හිතකර ආර්ථික වෘද්ධියක් නොවන බවය.)
- දේශීය කෘෂි කාර්මික අංශයේ දෘඪතාවන් සංශෝධනය නොකර සුළු ගොවි කෘෂි කාර්මික අංශයට නිර්බාධකරණ ප්‍රතිපත්තිය හඳුන්වා දීම මෙයට හේතු විය.

▪ "**යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන**" ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම (2002-2005). එම වැඩසටහන මගින් පෞද්ගලික ආයෝජන දිරිගන්වමින් වෙළෙඳපොළ නැඹුරු ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට එවක අගමැති ලෙස සිටි රනිල් වික්‍රමසිංහ මහතා සැලසුම් කර තිබුන ද එය ක්‍රියාවට නැංවීමට හැකි නොවීය.

- මෙම වැඩසටහන හරහා දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ද, ආර්ථික වෘද්ධිය අරමුණු කරගත් ප්‍රතිපත්ති ද පැවතිය. මෙය ප්‍රධාන කොටස් 3 කින් සමන්විත විය.
  1. අරමුණ → වර්ධන හි;කාමි දිළිදු හිතකාමි ආර්ථික ප්‍රතිපත්ති
  2. දිළිදුකම පිටුදැකීමේ ක්‍රියාමාර්ග
  3. කාර්ය සැලසුම නමුත් මෙය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
- 2004 සිදු වූ බල පෙරලිය, නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කොට ස්වදේශික ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩනගා ගැනීමට හැකි විය.
- 2006 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළ "මහින්ද චින්තන දස අවුරුදු දැක්ම" සංවර්ධන රාමුව තිරසාර පදනමක් මත ප්‍රාදේශීය ආර්ථික විෂමතාවයන් අඩු කිරීමට හැකි වන ආකාරයෙන් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යටිතල පහසුකම් හා දැනුම පදනම් කරගත් ආර්ථික වර්ධනයක් ළගා කර සංවර්ධන ක්‍රියාවලියන් දියත් කිරීම.

## මෙම සංවර්ධන රාමුවේ ඇතුලත් ක්‍රියාමාර්ග වූයේ

- මහා පරිමණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- කෘෂිකර්මය හා දේශීය ව්‍යවසාය ක්ෂේත්‍රය පුනර්ජීවයට පත් කිරීම
- රාජ්‍ය සේවය හා රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුලු පෞද්ගලික ව්‍යපාර අංශය ප්‍රවර්ධනය කිරීම
- ගම සවිබල ගැන්වීම ඔස්සේ ග්‍රාම කේන්ද්‍රීය සංවර්ධන ක්‍රියාවලියන් දියත් කිරීම
- ප්‍රාදේශීය විශමතා අවම කරමින් දිළින්දන්ට හිතකර වූ වෘද්ධි ක්‍රියාවලියක් ජනනය කිරීම සඳහා රාජ්‍ය ආයෝජන වියදම් වැඩි කිරීම මෙමගින් අපේක්ෂා කෙරුණි.
- ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමට ප්‍රධාන වෘද්ධි කේන්ද්‍ර හයක් ස්ථාපිත කිරීම



| | |
|---|---|
| **දැනුම කේන්ද්‍රස්ථානය** | • අධ්‍යාපන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා නැණසල, මහින්දෝදය විද්‍යා හා ගණිත විද්‍යාගාර, භාෂාගාර ඉදි කිරීම<br>• නවෝද්‍යා පාසල් ඉදි කිරීම<br>• පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීම |
| **සමුද්‍ර කේන්ද්‍රස්ථානය** | • හම්බන්තොට, කොළඹ වරාය සංවර්ධනය<br>• කොළඹ වරාය නගරය ඉදි කිරීම |
| **ගුවන් කේන්ද්‍රස්ථානයක** | • මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ඉදි කිරීම<br>• කටුනායක ගුවන්තොටුපල සංවර්ධනය<br>• අභ්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධනය |
| **වාණිජ කේන්ද්‍රස්ථානය** | • නගර සංකල්පය යටතේ කොළඹ නගරය පිරිසිදු කිරීම<br>• ජල ගැලීම් වලින් තොර නගරයක් ලෙස දියුණු කිරීම<br>• පරිපාලන ආයතන කෝට්ටේ නගරය කරා ගෙන යාම<br>• බේරේ වැව සහ අවට ප්‍රදේශ සංවර්ධනය කිරීම |
| **සංචාරක කේන්ද්‍රස්ථානය** | • ෂැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය<br>• පැරණි ගොඩනැගිලි නවීකරණය<br>• වරාය නගරය<br>• නෙළුම් කුළුණ<br>• පාවෙන වෙළෙඳපොළ |
| **බලශක්ති කේන්ද්‍රස්ථානය** | • නොරොච්චෝලි ගල් අඟුරු බලාගාරය<br>• ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය<br>• උමා ඔය ව්‍යාපෘතිය |

– තිරසාර සංවර්ධනයක් උදෙසා භෞතික ප්‍රාග්ධනය මෙන්ම මානව සංවර්ධනය කිරීම උදෙසා ප්‍රතිපත්ති මෙහෙයවන ලදී.

– තවද යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ගම නැගුම, මග නැගුම, දිවි නැගුම, ගැමි දිවිය, නැණසල ආදී ව්‍යාපෘති සමස්ත ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම.

– රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම බැහැර කරන ලදී.

– සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතා ඉවත් කිරීම සඳහා උතුරු වසන්තය, නැගෙනහිර උදානය, රජරට නවෝදය, වයඹ පුබුදුව, පුබුදමු වෙල්ලස්ස, කඳුරට උදානය, සබරගමු අරුණලෝකය ආදී වැඩසටහන් හරහා ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

– යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ වැඩසටහන "රන්දොර" නම් විය.

– පොහොර සහනාධාරය යළි ලබා දීම, ආහාර ආනයන අධෛර්යමත් කිරීම සඳහා සෙස් බදු යොදා ගැනීම, සහතික මිල ඇති කිරීම, කුඩා වාරිමාර්ග පුනුරුත්ථාපනය ආදී වැඩසටහන් තුලින් කෘෂිකාර්මික අංශය පුනර්ජීවනය කිරීම.

– ආහාර වලින් ස්වයංපෝෂිත වීමත්, ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත් අරමුණින් "**හදබිම**", "අපි වවමු රට නගමු", "**දිවි නැගුම"** ව්‍යාපෘති ඒ අතර සුවිශේෂී විය.

### මෙම අවධියේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ

දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තව දුරටත් ක්‍රියාත්මක කිරීම.
උදා: දිවි නැගුම, අපි වවමු රට නගමු

ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්, හෝටල් ඉදි කිරීම

2. විදේශ ආයෝජන සීමා වීම. -යුධමය හේතූන් මත ආයෝජන අඩු විය

3. උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම.

4. යටිතල පහසුකම් සංවර්ධනය. උදා: අධිවේගී මාර්ග ඇති කිරීම, මහාමාර්ග සංවර්ධනය

5. විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම

උදා: 2007 වසරේ ජාත්‍යන්තර බැදුම්කර ගනුදෙනුව

ජපන් රජයේ ආධාර ඇතිව නාගරික සංවර්ධනය

6. දේශීය කෘෂිකර්මාන්තය හා ඉදිකිරීම් කර්මාන්තය කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය

උදා: පොහොර සහනාධාරය, සහතික මිල

### 2015 සිට මේ දක්වා කාලය තුළ ආර්ථික ප්‍රතිපත්ති වල සිදු වූ වෙනස්කම්



2015-2019 මෛත්‍රීපාල සිරිසේන

**දැනුම් කේන්ද්‍රීය සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකය**

- **"2025 ආර්ථික දැක්ම" ආර්ථික ප්‍රතිපත්තිය එළිදැක්වීම.**
  - → 2025 වන විට ඒකපුද්ගල ආදායම වසරකට එ.ජ.ඩොලර් 5000 තෙක් ඉහළ නැංවීම.
  - → රැකියා දසලක්ෂයක් උත්පාදනය කිරීම.
  - → වසරකට විදේශ සෘජු ආයෝජන එ.ජ.ඩොලර් බිලියන 5 දක්වා ඉහළ නැංවීම.
  - → අපනයන ආදායම වසරකට එ.ජ.ඩොලර් බිලියන 20 දක්වා දෙගුණ කිරීම.
  - → මේ තුළින් ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් රටක් බවට පත්කිරීම.

- **2017-2020 තුන් අවුරුදු ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.**
  - → ඵලදායීතාවය හා තරගකාරීත්වය වැඩි කිරීම තුළින් අපනයන වැඩි කිරීම.
  - → ආයෝජන හිතකාමී ප්‍රතිපත්ති තුළින් ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
  - → රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණය මඟින් වාර්ෂික ණයසේවා බර අඩු කිරීම.
  - → රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට හා වියදම් අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
  - → මානව සම්පත්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය වියදම් වැඩි කිරීම.
  - → පළාත් අතර විෂමතා අඩුකිරීම.

- **තිරසර සංවර්ධන ඉලක්ක තුළින් රාජ්‍ය පාලනයේ ගුණාත්මකබව සවිමත් කිරීම.**

- **ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම.**
  - → ආර්ථික වර්ධනයට හා ඵලදායී රැකියා උත්පාදනයේ දී පුද්ගලික අංශය ද සමඟ එක්ව ප්‍රධාන ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය කිරීම.

- **ඩිජිටල් ආර්ථිකය,සංචාරක කර්මාන්තය හා වාණිජ කෘෂිකර්මාන්තය ව්‍යාප්ත කිරීම.**
  - → උදා: බස්නාහිර මහනගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම වියදම : ඇ.ඩො.බිලියන 40
  - → තේමාව : බලශක්තිය, ජල සැපයුම හා ප්‍රවාහනය
  - → ව්‍යාපෘති සංඛ්‍යාව : 160
  - → අරමුණ : ඩුබායි,සිංගප්පූරුව හා මුම්බායි නුවර මැද ඇති වැදගත්ම නගරය බවට 2030 දී පත්කිරීම.
- **ආපදා කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.**

- **පාඩු ලබන දේශීය වත්කම් දේශීය ආයෝජකයන්ට බදු දීම හෝ විකිණීම.**

- **එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන හඳුන්වාදීම.**

## 12.1.2 ආනයන ආදේශන කාර්මීකරණය මූලික ලක්ෂණ

විදේශ රට වලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සීමා පනවමින්, එම භාණ්ඩ දේශීයව නිෂ්පාදනය කර දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ පසුබිම් සකස් කිරීම, ආනයන ආදේශන කාර්මීකරණය ලෙස හඳුන්වා දිය හැකිය.

1959-1968 දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ දස අවුරුදු සැලැස්මෙහි පදනම ලෙස ආනයන ආදේශන කාර්මීකරණය ප්‍රතිපත්තිය හඳුන්වා දිය හැකිය.

- රාජ්‍ය අංශයේ සැලසුම්ගත ව්‍යාපෘති යටතේ බැර කර්මාන්ත සහ පෞද්ගලික අංශය යටතේ සුළු පරිමාණ හා ගෘහ කර්මාන්ත පවත්වා ගෙන යාම.
- 1963 වර්ෂය තුල ශ්‍රී ලංකාව සතු විදේශ විනිමය සංචිතය විශාල වශයෙන් පිරිහීම හේතුවෙන් ශ්‍රම සූක්ෂ්ම ආනයන ආදේශන කර්මාන්ත වලට ප්‍රමුඛත්වය ලබා දීම.
- ආනයන ආදේශන කර්මාන්ත ඇති කළ යුතු ක්ෂේත්‍ර සහ ප්‍රදේශ හඳුනා ගැනීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම.
  - දේශීයව අමුද්‍රව්‍ය සපයා ගැනීමේ හැකියාව
  - රැකියා උත්පාදනය
  - දේශීය වෙළෙඳපොළ අවශ්‍යතා
  - විදේශ විනිමය පිට රටවලට ගලා යාම වැළැක්වීම
  - ආනයන භාණ්ඩ වල මිල ඉහළ යාම
- භාණ්ඩ මිල කිරීම රාජ්‍ය ප්‍රතිපත්ති මත සිදු කිරීම
- ආනයන ආදේශන කාර්මීකරණය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් ලගා කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු,
  - දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම
  - රැකියා අවස්ථා බිහි කිරීම
  - විදේශ වෙළෙඳපොළ මත රැඳීම අඩු කිරීම

- විදේශ විනිමය පිටරටට ඇදී යාම වැළැක්වීම
- ආර්ථික වර්ධනය වේගවත් කිරීම
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- යටිතල පහසුකම් සංවර්ධනය

- ආනයන ආදේශන කාර්මීකරණය ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීම සඳහා පියවර ගැනීම
  - දේශීය ආයෝජන
  - ආනයන ආදේශන කර්මාන්ත සඳහා යොමු කිරීම පිණිස සානුබල සැපයීම
  - විදේශ ආයෝජන සඳහා අවසර දීමේදී ආනයන ආදේශන කර්මාන්ත වලට ප්‍රමුඛත්වය ලබා දීම
  - බදු විරාම සහ බදු සහන සැපයීම
  - යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
  - සහනදායී කොන්දේසි යටතේ ණය සැපයීම

## 12.1.3 කාර්මීකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය මහා පරිමාණ ව්‍යවසායන් හා සුළු පරිමාණ ව්‍යවසායන් මෙන්ම ස්වයං රැකියා මත පදනම් වූ ක්‍ෂුද්‍ර ගෘහ කර්මාන්ත වලින් ද සමන්විත මෙම දේශීය කර්මාන්තයට සහයෝගය දෙමින් වෙළෙඳපල ඉලක්කරගත් තරගකාරී භාණ්ඩ හා සේවා නිපදවනු ලබන කර්මාන්ත බිහිකිරීමේ හා වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය යි.

### මූලික ලක්‍ෂණ

- සම්පත් මූලික වූ අපනයන කර්මාන්ත නගාසිටුවීම.
- දේශීය අමුද්‍රව්‍ය සඳහා එකතුකළ අගයක් ලබාදීම.
- දේශීය වෙළෙඳපල තුළ නව අවස්ථා ඇතිකිරීම.
- කලාපීය වශයෙන් කර්මාන්ත නගාසිටුවීම.
- ග්‍රාමීය ප්‍රදේශවල නව කර්මාන්ත ඇතිකිරීම.



## 12.2.4 ආනයන ආදේශන ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය

ධන ප්‍රතිවිපාකය

- සුඛෝපභෝගී භාණ්ඩ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මත ආනයනය සීමා පාලනය කර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය දිරිමත් කිරීම හරහා විදේශ විනිමය අර්බුදය සහ ගෙවුම් ශේෂ ගැටලු වලට විසඳුම් ලබා දීම.
- අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සීමා කළ අතර, එම භාණ්ඩ දේශීය නිෂ්පානයට සහ අභ්‍යන්තර හුවමාරු කිරීම මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කිරීම
  - උදා: හාල්, මිරිස්, ලුණු ප්‍රවාහනය සීමා කිරීම.
- ආනයන ආදේශන කෘෂි නිෂ්පදිතයන් ලෙස සහල්, ලූනු, මිරිස්, කවුපි, සෝයා, මුං ඇට, කුරහන් ආදී නිෂ්පාදිතයන් සහ ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදිපිළි, ඇගලුම්, බෙහෙත් ද්‍රව්‍ය ආදී පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරි ගැන්වීම.
- දේශීය වෙළෙඳෙපොළ තුල භාණ්ඩ මිල අඩු කිරීම.
- ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩු වීම
- රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ආර්ථිකය පහසුවෙන් මෙහෙයවීම

දුර්වලතා

- රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණයේ පැවති අඩු පාඩු හේතුවෙන් එම කර්මාන්ත බොහොමයක් අකාර්යක්ෂම බවට පත්ව රාජ්‍ය වැයට විශාල බරක් වීම
- කර්මාන්ත වල නිෂ්පාදන කටයුතු ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ශිල්පීය ක්‍රම මත රඳා පැවතීම නිසා, අපේක්ෂා කල ආකාරයට සේවා නියුක්ත අවස්ථා බිහි කිරීමට නොහැකි වීම.
- කර්මාන්ත වල ධාරිතාවය උපරිම ලෙස භාවිතා කිරීමට අවශ්‍යය සම්පත් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීම.
- නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පැවතීමත්, නිෂ්පාදන ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතීමත් නිසා ලෝක වෙළෙඳපොළ කරා පිවිසීමට බාධා ඇති වීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී නිලධාරිවාදය දැඩිව ඉස්මතු වීම

## 12.1.5 කාර්මීකරණ ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය

- කාර්මික සංවර්ධනය ඇතිකිරීම.
- ඵලදායී සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම.
- සුළු හා මහා පරිමාණ ව්‍යවසායන් ශක්තිමත් කිරීම.
- කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය ඉහළ නැංවීම.
- ග්‍රාමීයව හා නාගරිකව කාර්මීකරණයේ අසමතුලිතතා අවම කිරීම.
- මානව සම්පත් සංවර්ධනය
- උසස් තාක්‍ෂණික ක්‍රමවේද අනුගමනය කිරීම.
- සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂෙත්‍රය දියුණු කිරීම.

## 12.1.6 අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය අර්ථකථනය

### අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය

විදේශ වෙළෙඳපොළ ඉලක්ක කර දේශීය වශයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හැඳින්වෙන්නේ අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය ලෙසය. දේශීය නිෂ්පාදනයේදී සාපේක්ෂ වාසි පවතින භාණ්ඩ විදේශ වෙළෙඳපොළ වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලබයි.

1965 වර්ෂයේ සිට අපනයන අභිමුඛ කාර්මීකරණය කෙරෙහි ශ්‍රී ලංකාව යොමු විය. 1965-1988 කාල පරාසය තුල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් අනුගමනය කරන ලද ඇතැම් ක්‍රියා මාර්ග පහත පරිදි දැක්විය හැකිය.

| | |
|---|---|
| 1965 | අපනයන කර්මාන්ත සඳහා බදු ප්‍රතිපාදන ලබා දීම |
| 1966 | තෝරාගත් සුළු අපනයන සඳහා විදේශ විනිමය පරිවර්තන රුපියල් ගිණුම් ක්‍රමය හඳුන්වා දීම |
| 1967 | රුපියලේ විදේශ අගය අවප්‍රමාණය කිරීම |
| 1968 | විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාවට නැංවීම |
| 1969 | කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීම |
| 1972/77 | පස් අවුරුදු සැලැස්මේ අපනයන ප්‍රවර්ධන ප්‍රධාන ඉලක්කයක් වීම<br>අවුරුදු 8 ක බදු විරාමයක් ලබා දීම<br>අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම |
| 1977 | විදේශ විනිමය ගෙවීම සම්බන්ධයෙන්පැවති විවිධ සංරෝධක ඉවත් කිරීම<br>.සෘජු විදේශ ආයෝජන ඉහළ නැංවීම |
| 1978 | මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටු වීම<br>කටුනායක, බියගම, පල්ලේකැලේ, කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටු වීම |
| 1979 | ඇඟළුම් කර්මාන්ත ශාලා ආරම්භ කිරීම |

## නිර්බාධකරණය

- 1977 එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීමත් සමඟ රාජ්‍ය කේන්ද්‍රීය කරගත් සංවර්ධන ප්‍රතිපත්තිය නිමා වූ අතර පෞද්ගලික අංශය දිරිමත් කිරීමටත් ආර්ථිකය නිර්බාධකරණය කිරීමටත් යොමුවිය.

## 12.1.7 අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ

### නිර්බාධිකරණ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

- ආනයන වෙළෙඳාම සහ විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කිරීම
- විදේශීය ප්‍රාග්ධන ආයෝජන දිරිමත් කිරීම
- මුදල් අවප්‍රමාණය සහ නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් හඳුන්වාදීම
- පෞද්ගලික අංශයේ කාර්යභාරය පුළුල් කිරීම
- මිල පාලනයන් ඉවත් කිරීම
- පාරිභෝගිකයන්ට සහ නිෂ්පාදකයන්ට දෙනු ලබන විවිධ සහන සැලකිය යුතු තරමින් කපා හැරීම
- රාජ්‍ය ව්‍යවසායන්ට කෙරෙන අයවැය පැවරුම් සීමා කිරීම

### අපනයනාභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

- අපනයන සඳහා ඇඟළුම් කර්මාන්ත ශාලා ඇරඹීම
- සාම්ප්‍රදායික නොවන අපනයන දිරිමත් කිරීමට කටයුතු කිරීම. උදා තේ, පොල්, රබර්, මැණික්, කැටයම්, බතික්, කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි
- බදු සහන ලබා දීම.
- GSP පැකේජය හා GSP+ පැකේජය ලබා ගැනීම.
- අපනයන ගම්මාන හා කාර්මික උද්‍යාන බිහි කිරීම.
- විදේශ වෙළෙඳපොළ ඉලක්ක කරගත් සෘජු විදේශ ආයෝජන වලට ප්‍රමුඛත්වය ලබා දීම.
- BMSTC හා SARC වැනි කලාපීය ආර්ථික සංගම් වල සාමාජිකත්වය ලබා ගැනීම හා ද්වි පාර්ශවික හා බහු පාර්ශවික වෙළෙඳ ගිවිසුම් යටතේ විදේශ වෙළෙඳපොළට ප්‍රවේශ වීම. .

## 12.1.8 අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්ති මගින් ආර්ථිකයට වූ බලපෑම

### අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ආර්ථිකයට වූ බලපෑම

**ධන ප්‍රතිවිපාක**

- විදේශ විනිමය උපයා ගැනීමට හැකි වීම.
- සේවා නියුක්තිය ඉහළ යාම.
- දේශීයසම්පත් උපයෝජනය වර්ධනය වීම.
- දියුණුතාක්ෂණය භාවිතා කිරීමට හැකි වීම.
- දේශීය මුදලේ අගය පිරිහීම වළක්වා ගත හැකි වීම.
- රජයට ලැබෙන ආදායම් ඉහළ යාම.
- ආර්ථිකවර්ධනය වේගවත් කර ගැනීමට දායක වීම.

## සෘණ ප්‍රතිවිපාක

- ලෝක වෙළෙඳපොළ මත ආර්ථිකය රඳා පැවතීම.
- අපනයන භාණ්ඩ වල ලෝක වෙළෙඳපොළ මිල උච්ජාවචනය වන විට දේශීය ආර්ථිකයට විශාල අයහපත් බලපෑම් ඇති වීම.
- අපනයන භාණ්ඩ වලට ලෝක වෙළෙඳපොළ දී විශාල තරගයකට මුහුණ දීමට සිදු වීම.
- විදේශ සෘජු ආයෝජනයන් උපයන්නන් ලාභ මව් රටට රැගෙන යාම.
- අපනයන අභිමුඛ කර්මාන්ත සඳහා විශාල මුදලක් එක විට ආයෝජනය කිරීමට සිදු වීම.
    - දේශීයවෙළෙඳපොළේ පවතින උද්ධමනකාරී තත්ත්වහේතුවෙන් අපනයන වල තරගකාරී ශක්තිය අඩු වීම.
- ඇතැම් විදේශ වෙළෙඳපොළවල් ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ රට වල හා ආයතන වල කොන්දේසි වලට යටත් වීමට සිදු වීම.

## නිර්බාධකරණ ප්‍රතිපත්තියේ ආර්ථික ප්‍රතිවිපාක

- පාවෙන පාලිත විනිමය අනුපාත ක්‍රමයක් බිහිවීම.
    - ඒ අනුව විනිමය අනුපාතිකය ඩොලරයට සාපේක්ෂව 46% කින් අවප්‍රමාණය කරන ලදී.
- ප්‍රශංසනීය වූ ආර්ථික වෘද්ධියක් හා ව්‍යුහාත්මක පරිවර්තනයක් ඇති වීම.
    - 1978-1982 කාලය තුළ දී වාර්ෂික ආර්ථික වෘද්ධි අනුපාතිකය 2.9% සිට 6% දක්වා වර්ධනය වීම.
- ආයෝජන අනුපාතය 1977-1982 කාලය තුළ දී 16% සිට 30% දක්වා වර්ධනය වීම.
- විරැකියා අනුපාතය පහළ වැටීම.
- 1985 වන විට කාර්මික අපනයන 40% දක්වා ද ,1995 වන විට 75% දක්වා ද වර්ධනය වීම.
- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන මත යැපීම අඩුවීම.
- 1983 හටගත් ජනවාර්ගික අර්බුදය නිසා දේශපාලන අවධානම වැඩිවීම.
    - 1980 දශකයේ මොටරෝලා සහ හැරිස් කෝපරේෂන් යන සමාගම් ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කළද දේශපාලන තත්ත්ව පිරිහීම මත ඒවා බිඳවැටීම.

## 12.2. ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා පිළිබඳ ගවේෂණය



TRC
Telecommunications Regulatory Commission of Sri Lanka
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
www.OnlineJobs.lk


Sri Lanka Telecom
Mobitel
We Care. Always.

## 12.2.1. නිෂ්පාදනය හා එහි සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්

❖ <u>දළ දේශීය නිෂ්පාදනයේ ව්‍යුහාත්මක වෙනස්කම්</u>

- කෘෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම.
- කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම.
- සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම.

### ❖ නිෂ්පාදිතයේ ආංශික සංයුතිය




### ❒ දළ දේශීය නිශ්පාදනයේ ආංශික සංයුතිය තුළ ව්‍යුහාත්මක වෙනස්වීම් වලට බලපෑ හේතු.

- දළ දේශීය නිශ්පාදනයේ ආංශික සංයුතිය තුළ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම අඩු වී කාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම සහ සේවා අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම වැඩි වී ඇත.

  1) 1977 අපනයන අභිමුක කාර්මීකරණ ප්‍රතිපත්තිය
  2) ආර්ථික වර්ධනය හා සංවර්ධනය
  3) කෘෂි නිෂ්පාදිත වලට වඩා කාර්මික හා සේවා නිෂ්පාදිත සඳහා ඉල්ලුම වේගයෙන් ඉහළ යාම.
  4) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය.

### ❖ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය

| 2016 | 2017 | 2018 |
|---|---|---|
| **4.5%** | 3.4% | 3.2% |

ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේදී වාර්තා කල 3.4% ක වර්ධනයට සාපේක්ෂව දේශීය හා විදේශීය වශයෙන් වූ අයෝග්‍යාත්මක වාතාවරණය හමුවේ 3.2% ක අඩු වර්ධන වේගයක් වාර්තා කරන ලදි.

**නිමවුම, ප්‍රතිපත්ති හා ආයතනික සහය**

**කෘෂිකාර්මික අංශය**

කෘෂිකාර්මාන්තය ආශ්‍රිත ආර්ථික කටයුතු වල වර්ධනය (%)

| 2017 | 2018 |
| --- | --- |
| **0.4%** | 4.8% |

- 2017 වසරේදී වාර්තා කල 0.4%ක පහත වැටීමට සාපේක්ෂව 2018 වසරේදී 4.8%ක වර්ධන වේගයක් වාර්තා විය.
  - කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා බලපෑ හේතු
  - ප්‍රධාන වගාබිම් ආශ්‍රිත ප්‍රදේශවල වසර පුරාවට පැවති හිතකර කාලගුණික තත්ත්වයයි.
  - කෘෂිකාර්මික අංශය සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම
  - කෘෂිකාර්මාන්තය නගා සිටුවීම සඳහා රජයේ අවධානය ඉහළ යාම.
  - කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය සැලකිය යුතු ලෙස පහල යාම.

- **කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා හඳුන්වා දුන් කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ආයතනික සහය**

1) කෘෂිකාර්මික අංශය නවීකරණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .
2) කෘෂි වාරි සංවර්ධන ව්‍යාපෘතිය පළාත් 6ක් තුල ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීම.
3) වගා හානි වැලක්වීම පිළිබඳව (වන සතුන්ගෙන්) වැඩි අවධානයක් යොමු කිරීම.
4) ඉක්මනින් නරක්වන කෘෂි නිශ්පාදන පිළිබඳව සැලකිල්ලට ගනිමින් උෂ්ණත්වය පාලනය කල හැකි ගබඩා සංකීර්ණයක් ස්ථානගත කිරීම.
5) කෘෂිකාර්මික අංශයෙ අවදානම් වලට(සේනා දළඹු උවදුර) මුහුණ දීමේ හැකියාව වැඩි දියුනු කිරීමට ශක්තිමත් කෘෂිකාර්මික නිරෝධායන රාමුවක් හඳුන්වා දීම.

**කාර්මික අංශය**

(කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතු වල වර්ධනය (%))

| 2017 | 2018 |
| --- | --- |
| **4.1%** | 0.9% |

- 2018 වසරේදී කර්මාන්ත කටයුතු වලට එකතු කල අගය 2017 වසරේදී වාර්තා කළ 4.1% ක වර්ධනයට සාපේක්ෂව, 0.9% ක සුළු වර්ධනයක් වාර්තා විය.
- කර්මාන්ත අංශයේ දායකත්වය අඩු වීමට බලපෑ හේතු
  - ඉදිකිරීම් හා පතල් කැනීම් කටයුතු වල දක්නට ලැබුණු පහත වැටීම.
  - වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය වල සිදු වූ පහළ යම.

- **කාර්මික අංශය නගා සිටු වීම සඳහා හඳුන්වදුන් කාර්මික ප්‍රතිපත්ති හා ආයතනික සහය**

1) නිශ්පාදන කර්මාන්තයට අවශ්‍ය අධි යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමේදී පනවා තිබූ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් 75% ක සහනයක් ලබා දීම.
2) අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම .
3) විශේෂ කාර්මික පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරී.
4) අපනයන තරගකාරීත්වය සහතික කිරීම සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා සහාය වීම.

**සේවා අංශය**

සේවා අංශයේ ආර්ථික කටයුතු වල වර්ධනය (%)

| 2017 | 2018 |
|---|---|
| 3.6% | 4.7% |

- සේවා ආශ්‍රිත ආර්ථික කටයුතු 2017 වසරේදී වාර්තා කල 3.6% ක වර්ධනයට සාපේක්ශව 2018 වසර තුළදී 4.7% ක වර්ධනයක් වාර්තා කරන ලදි.
- මේ සඳහා ප්‍රධාන හේතුව වූයේ,
  - මූල්‍ය සේවා කටයුතු වල ඉහළ වර්ධනය වීම.(ප්‍රධානම හේතුව)
  - තොග හා සිල්ලර වෙළදාම ඉහළ යාම.
  - ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදු වූ වර්ධනය
  - සංචාරක කර්මාන්තයේ සිදු වූ වර්ධනය නිසා නවාතැන් හා ආහාර පාන සැපයීමේ සේවාවන් ඉහළ යාම.

## 12.2.2. සේවා නියුක්තිය

❒ **සේවා නියුක්ත පුද්ගලයන්"** යනු

විමර්ෂණය කරන කාලය තුළදී, ආර්ථිකමය වශයෙන් සඵලදායී කටයුත්තක නිරත ව සිටින, එනම් රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ වැටුප් ලබන සේවකයන්, සේවා යෝජකයන්, ස්වයං රැකියාවේ නියුතු පුද්ගලයන් සහ වැටුප් නොලබා පවුලේ ආර්ථිකයට දායකවන පුද්ගලයින් ය.

### සේවා නියුක්ති අනුපාතය

සේවා නියුක්ත පිරිස, එරට ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ඇතුළත් කිරීමෙන් "**සේවා නියුක්ති අනුපාතය**" ලැබේ.

$$\text{සේවා නියුක්ත අනුපාතය} = \left(\frac{\text{සේවා නියුක්ත පිරිස}}{\text{ශ්‍රම බලකාය}}\right) \times 100$$

## ශ්‍රම බලකාය

වයස අවුරුදු 15 සහ ඊට වැඩි, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය "**ශ්‍රම බලකාය**" හඳුන්වයි. 2017 වසරේ වාර්තා වූ මිලියන 8.567 සාපේක්ෂව 2018 වසරේදී මිලියන 8.388 දක්වා 2.1% පහළ යන ලදී.

ශ්‍රම බලකාය =සේවා නියුක්ත පුද්ගලයන් + සේවා වියුක්ත පුද්ගලයන්

- 2019 වසරේ,
    - සේවා නියුක්ත පුද්ගලයන් - මිලියන 8.592
    - සේවා වියුක්ත පුද්ගලයන් - මිලියන 0.412
- 2018 වසරේ,
    - සේවා නියුක්ත පුද්ගලයන් - මිලියන 8.388
    - සේවා වියුක්ත පුද්ගලයන් - මිලියන 0.369

- 2018 වසරේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයන් පහත පරිදි වේ.



**මිලියන 5.46**

පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය - 73.0%



**මිලියන 2.92**

ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය - 33.6%

- පෙර වසරට සාපේක්ෂව 2018 වසරේදී, ස්ත්‍රී ශ්‍රම බලකාය 6.7% කින් අඩු වී ඇත.
    - වැඩ කරන වයසේ පසුවන කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් ආර්ථික වශයෙන් ජාතික ආර්ථිකයට දායක නොවීම මීට හේතුවයි.

**ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය පහල අගයක් ගැනීමට හේතු,**

- රැකියා සඳහා අවශ්‍ය නිපුණතා සම්බන්ධ ගැටළු
- ශ්‍රම වෙළඳපොළ තුල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා අවම වීම
- ස්ත්‍රී පුරුෂ විෂමතා
- යල්පැන ගිය සමාජ සම්මත
- ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් අපේක්ෂා කරන සමාජ භූමිකා, වගකීම් ඉටුකිරීමට ඉදිරි සිටීම.

එබැවින් කාන්තාවන් ආර්ථික වශයෙන් වඩා සක්‍රිය වීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට නම්,


- නම්‍යශීලී සේවා මුර
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම
- ලිංගික හිංසනය පිටුදැකීම
- ගුණාත්මක ළමා හා වැඩිහිටි සුරැකුම් පහසුකම්
- ආරක්ෂාකාරී ප්‍රවාහනය වැනි ආධාරක පහසුකම් ලබා දීමට අවශ්‍ය ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## ශ්‍රී ලංකාවේ මෑත කාලීන සේවා නියුක්තියේ ස්වභාවය


2018 වසරේදී, සේවා නියුක්ත පිරිස මිලියන 8.38 ක් විය.

- ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සේවා නියුක්තිය 95.6% කි. එම අගය පෙර වසරට සාපේක්ෂව 0.2% ඉතා සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.
- "**ආර්ථික ක්‍රියාකාරීත්වය අනුව**" එනම් ආර්ථිකයේ විවිධ අංශ, 2018 වසරේදී සේවා නියුක්තියට කරනු ලැබූ දායකත්වය මෙසේය.

**"ආර්ථික ක්‍රියාකාරීත්වය අනුව"** සේවා නියුක්ති අනුපාතය




- වසරේ දත්ත හා සසඳන විට කෘෂි (26.1%) හා කාර්මික (28.4%) යන අංශ ද්විත්වයෙහිම දායකත්වය අඩු වුවද, සේවා අංශයහි (45.5%) දායකත්වය 2018 වසරේදී වැඩිවී ඇත.
- "රැකියාවේ සේවා තත්ත්වය" අනුව 2018 වසරේ සේවා නියුක්තිය මෙසේ වේ.




## සේවා වියුක්තිය

- එලදායී ආර්ථික ක්‍රියාවක යෙදීමට අපේක්ෂාවෙන් සිටින නමුත් ඒ සඳහා අවස්ථාවක් නොලැබුණු පිරිස "**සේවා වියුක්ත පිරිස**" වේ.


- එලදායී ආර්ථික ක්‍රියාවක යෙදීමට අපේක්ෂාවෙන් සිටින නමුත් ඒ සඳහා අවස්ථාවක් නොලැබීම මත ඇතිවන තත්ත්වය"**සේවා වියුක්තිය**" වේ.

### සේවා වියුක්ති අනුපාතය

සේවා වියුක්ත පිරිස, එරට ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ඇතුළත් කිරීමෙන් "සේවා වියුක්ති අනුපාතය" ලැබේ.

$$\text{සේවා වියුක්ත අනුපාතය} = \left(\frac{\text{සේවා වියුක්ත පිරිස}}{\text{ශ්‍රම බලකාය}}\right) \times 100$$

2019 දී මෙම අනුපාතය ට 4.8% කි




**ශ්‍රී ලංකාවේ මෑත කාලීන සේවා වියුක්තියේ ස්වභාවය**

- ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සේවා වියුක්තිය 4.4% කි. එම අගය පෙර වසරට සාපේක්ෂව 0.2% ඉහළ යාමක් පෙන්නුම් කරයි.
- පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතය ඉහළ අගයක් ගන්නා අතර එය, මේ වන විට ශ්‍රී ලාංකාව තුල ප්‍රධාන ගැටලුවක් බවට පත්වී ඇත.
- වසර හා සසඳන කල, අ.පො.ස. (උ.පෙළ) හා ඊට ඉහළ කාණ්ඩයෙහි 1.0% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි.
- අධ්‍යාපනයෙන් ඉහළ පිරිසේ සේවා වියුක්තිය වඩා ඉහළ අගයක් ගන්නා අතර, ශ්‍රී ලාංකාව තුල උගත් සේවා වියුක්තියක් ඇති බව ඉහත දත්ත පෙන්නුම් කරයි.

**විදේශ සේවා නියුක්තිය**

- විදේශ රැකියා සඳහා පිටවගිය කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගිය ද විදේශ රැකියා සඳහා පිටවගිය මුළු සංඛ්‍යාව සුළු වශයෙන් පහළ ගියේය.

විදේශ රැකියා සඳහා පිටවගිය සංඛ්‍යාව

| කාණ්ඩය | 2017 | 2018 |
|---|---|---|
| පුරුෂ | 139,268 | 129,774 |
| ස්ත්‍රී | 72,724 | 81,685 |

- වසරේ සිට 2018 සලකා බලන විට පුරුෂ පිටවයෑම් 6.8% පහළ ගියද ස්ත්‍රී පිටවයෑම් 12.3% දක්වා ඉහළ ගොස් ඇත.

- එමනිසා සමස්ථ විදේශ රැකියා සංඛ්‍යාව 2017 වසරේ 211,992 සිට 2018 වසරේ 211,459 ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය.
- වසරේ විදේශ සේවා නියුක්තික 129,774 ක් වූ පුරුෂ සංඛ්‍යාව සමස්ථයෙන් 61.4% ක් වන අතර 81,685 ක් වූ ස්ත්‍රී සංඛ්‍යාව සමස්ථයෙන් 38.6% ක් වේ.

**ශ්‍රම කාණ්ඩ අනුව ගත් කළ, විදේශ සේවා නියුක්තිය ප්‍රධාන අංශ හතක් යටතේ වෘත්තීය, මධ්‍යම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු ශ්‍රමික, අර්ධ පුහුණු ශ්‍රමික, නුපුහුණු ශ්‍රමික හා ගෘහ සේවිකා වශයෙන් වර්ගීකරණය කළ හැක.**

- ඒ අතරින් 31.7% ක් පුහුණු ශ්‍රමිකයන් ප්‍රමුඛ වන අතර 30.7% ක් ගෘහ සේවිකා හා 24.5% ක් නුපුහුණු ශ්‍රමික වශයෙන් 2018 වසරේ සමස්ථයට දායක වේ.
- එසේම වෘත්තීය ශ්‍රමිකයන් 3.4% වන අතර අර්ධ පුහුණු ශ්‍රමිකයන් 1.3% ක් වූ අඩු අගයන් ගෙන් සමස්ථ විදේශ සේවා නියුක්තියට දායක වේ.
- වසරට සාපේක්ෂව 2018 වසරේ දී නුපුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා පිටව යෑම් 15.3% කින් අඩු වුවද, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ තවදුරටත් විදේශ රැකියා සඳහා සමස්ථ පිටව යෑම් වලින් 55.2% ක් නියෝජනය කරයි.

**ගමනාන්ත අනුව ගත් කළ සෞදි අරාබිය, කටාර්, කුවේට, එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවලට සංක්‍රමණය වීම් ප්‍රධාන වේ.**

- සමස්ථ පිටව යෑම් වලින් 88.2% ක් පමණ වාර්තා කරමින් මැද පෙරදිග කලාපය තවදුරටත් රැකියා සඳහා විදේශ ගතවීම ප්‍රමුඛ ස්ථානයේ රැඳී සිටියි.
- ගෘහ සේවිකාවන්ගෙන් 97.4% ක් හා නුපුහුණු ශ්‍රමිකයන්ගෙන් 78.0% සෞදි අරාබිය, කටාර්, කුවේට්, සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි මැද පෙරදිග රටවලට සංකේන්ද්‍රණය වී ඇත.
- ස්ත්‍රී පුරුෂභාවය අනුව සැලකූ විට පුරුෂ පිටවයෑම් වලින් 85% ක් සහ කාන්තා පිටවයෑම් වලින් 93.3% ක් මැද පෙරදිග කලාපය තුළ සංකේන්ද්‍රණය වී ඇත.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ සංක්‍රාම හෙවත් ප්‍රේෂණ**

- වසරේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 7,164 ක් වූ අතර එය 2018 වසරේ එ.ජ.ඩොලර් මිලියන 7,015 ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. 2018 වසරේ ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් බිලියන 7 කි.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව මන්දගාමී වීම් හේතුවෙන් ද්විතියික ආදායම් ගිණුම වෙත ලැබීම් 2018 වසරේ අඩු මට්ටමක පැවතුණි.

ද්විතියික ආදායම් ගිණුමේ ලැබීම් සඳහා වැඩි දායකත්වයක් සපයන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2017 වසර තුළ 1.1% කින් අඩු වීමෙන් පසව, 2018 වසරේදී එ.ජ.ඩොලර් මිලියන 7,015 ක් දක්වා 2.1% කින් අඩු විය.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වල දක්නට ලැබුණු මෙම අඛණ්ඩ අඩුවීමේ ප්‍රවණතාය සඳහා

- ඛණිජ තෙල් මිල විචලනය හමුවේ මැද පෙරදිග රටවල ඇති වී තිබෙන දේශපාලනික අස්ථාවරත්වය සහ
- ගෝලීය ආර්ථික වර්ධනයේ මන්දගාමී වීම් දැක්විය හැකිය.

**විදේශ සේවා නියුක්තියේ වැදගත්කම**

- විරැකියා අනුපාතය අඩු කිරීම සහ ආදායම් ඉපයීම මගින් දිළිඳුකම අඩු කිරීම සඳහා ඉටුකරන සැලකිය යුතු කාර්ය සහ පෞද්ගලික ප්‍රේෂණ විදේශ විනිමය ඉපයීමේ මූලාශ්‍ර එකක් වීම හේතුවෙන්, විදේශ රැකියා ශ්‍රී ලංකාවේ ආර්ථික කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි.

**විදේශ සේවා නියුක්තියේ ඵලදායීතාව වෙනුවෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග**

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රම සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා වන ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- විදේශ රැකියා සඳහා නීති විරෝධී ලෙස පුද්ගලයන් බඳවා ගැනීම සම්බන්ධ වැටලීම් සිදු කිරීම
- නීති උල්ලංඝනය කළ නීති විරෝධී ආයතන සහ බලපත්‍ර ලාබී ආයතන වලට එරෙහිව නඩු පැවරීම.
- සංක්‍රමණික සේවකයන් සඳහා සුභසාධන සහ ආරක්ෂක පියවර ලෙස, සංක්‍රමණික සේවකයන් ආවරණය වන පරිදි රක්ෂණ ආයතන සඳහා ගෙවීම්.
- සංක්‍රමණික සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම
- මැදපෙරදිග, යුරෝපා සහ නැගෙනහිර ආසියාතික රටවල් වූ සිංගප්පූරුව, සයිප්‍රසය, හොංකොං හා මාලදිවයින වැනි රටවලට පිටව යෑම සඳහා අනිවාර්ය පෙර පුහුණුවක් ලෙස වෘත්තීය නිපුණතා සහතිකය (හඬු) 3 මට්ටම හඳුන්වා දීම.
- සංක්‍රමණික සේවකයන්ට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කර්යාංශයේ මෙහෙයුම් කටයුතු දීප ව්‍යාප්තව වැඩි දියුණු කිරීමේ අරමුණින් සෑම පළාතකම සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටු වීම.

## 12.2.3. යටිතල පහසුකම් සංවර්ධනය

නිශ්පාදනය හා හුවමාරුව කාර්යක්ෂමව සිදුවීම සඳහා මූලික යටිතල පහසුකම් කීපයක් සපුරා ගත යුතුය. ඒවා අතර වාරිමාර්ග, වරාය, ගුවන්තොටුපොළ, සංනිවේදනය, විදුලිය හා ජලය ප්‍රධාන තැනක් ගනී. මෙම සේවාවන් අඛණ්ඩව සැපයීම නිශ්පාදනයේ කාර්යක්ෂමතාව අවශ්‍ය වේ. එහෙත් බොහෝ සංවර්ධනය වන රටවල යටිතල පහසුකම් ප්‍රබල දුර්වලතා දක්නට ලැබේ. මෙය එම රටවල ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට බලපාන සංරෝදකයක් වේ.

### ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් ඉලක්ක කර ගත් සේවා

**ප්‍රවාහන සේවා :-** කොළඹ මාතර අධිවේගී මාර්ගය



**විදුලි සංදේශ සේවා :-** ශ්‍රී ලංකා විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාව



**ජල විදුලිය උත්පාදනය :-** කොත්මලේ ජල විදුලි බලාගාරය



**බලශක්ති උත්පාදනය :-** නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය



<u>**මෙම සේවාවන්හි දියුණුවට රජය ගෙන ඇති පියවර**</u>

1. විදේශ ආධාර හා ආයෝජන ලබා ගැනීම.
2. පුද්ගලික අංශයද සම්බන්ධ කර ගැනීම.

**ආර්ථික හා සමාජ යටිතල පහසුකම්**

| ආර්ථික යටිතල පහසුකම් | |
|---|---|
| **දෘඩ යටිතල පහසුකම්** | මෘදු පොදු කාර්ය පහසුකම් |
| මහාමාර්ග | මූල්‍ය ආයතන පද්ධතිය |
| වරාය | ශ්‍රම බලකා නිපුණතා සංවර්ධනය |
| වාරිමාර්ග | වෘත්තීමය පුහුණු වීම් |
| ඇලවේලි | තාක්ෂණය හුවමාරු කිරීමට අදාල වැඩසටහන් |

| සමාජ යටිතල පහසුකම් | |
|---|---|
| **දෘඩ යටිතල පහසුකම්** | මෘදු පොදු කාර්ය |
| පාසල් | සමාජ සංරක්ෂණ ක්‍රම |
| රෝහල් | ප්‍රජා සේවාවන් |
| නිවාස යෝජනා ක්‍රම | පරිසර සංරක්ෂණ වැඩසටහන් |

**යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය මගින් ගෙන ඇති පියවර**

❖ **රජයේ දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ( 2006 - 2016)**

මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ යෝජනා කර ඇති උපාය මාර්ග ක්ෂේත්‍ර 3 ක් යටතේ සාකච්ඡා කරයි.

- යටිතල පහසුකම් සංවර්ධනය
- ග්‍රාමීය සංවර්ධනය
- අවශ්‍ය ජන කොටස් සඳහා සමාජ ආරක්ශක ජාලය

**දස අවුරුදු සැලෙස්මෙහි ඉලක්ක.**

- 2016 වන විට 8% කට වැඩි අඛණ්ඩ ආර්ථික වර්ධනයක් ලබා ගැනීම
- ඒක පුද්ගල ආදායම දෙගුණයක් එනම් ඇමරිකන් ඩොලර් 4000 ඉක්මවීම.
- ග්‍රාමීය අංශයේ රැකියා ප්‍රමාණය 2/3 ක් දක්වා වර්ධනය
- අයවැය හිගය, රාජ්‍ය ණය හා උද්ධමනය පහල මට්ටමකට ගෙන්වීම.

**රන්දොර ජාතික යටිතල පහසුකම් සංවර්ධන ප්‍රවේශය**

රන්දොර ජාතික යටිතල පහසුකම් සංවර්ධන ප්‍රවේශය යනු අප රටේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඇති සුවිශේෂී ව්‍යාපෘතියකි. ප්‍රවාහනය, සංනිවේදණය, රක්ෂණය ජලසම්පාදන හා සනීපාරක්ෂක සේවා, බලශක්ති, කෘෂිකර්මය හා වාරිමාර්ග වැනි ආර්ථික සේවා ඉහළ දැමීමට මේ වැඩසටහන මූලික වේ.

❖ **මෙම ව්‍යාපෘතිය යටතේ පහසුකම් වලට නිදසුන් පහතින් දැක්වේ.**

- වීරවිල ගුවන් තොටුපොළ
- හම්බන්තොට වරාය සංකීර්ණය
- හම්බන්තොට පරිපාලන සංකීර්ණය
- නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය
- ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය
- කෙරවලපිටිය ගල් අඟුරු බලාගාරය
- උතුරු මහාමාර්ගය
- මහා දඹුල්ල සංවර්ධනය
- මහ කොළඹ ජල ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය

**යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා පුද්ගලික අංශයේ දායකත්වය**

මේ සඳහා රජය විවිධ ක්‍රම යටතේ පුද්ගලික අංශය සම්බන්ධ කර ගනී. ඒවා නම්;

- **ඉදිකිරීම**, **මෙහෙයවීම** හා **පැවරීම** (BOT ක්‍රමය)
- **ඉදිකිරීම**, **හිමිකර ගැනීම** හා **මෙහෙයවීම** (BOO ක්‍රමය)
- **ඉදිකිරීම**, **හිමිකර ගැනීම**, **මෙහෙයවීම** හා **පැවරීම** (BOOT ක්‍රමය)

**රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වයේ වැදගත්කම**

- අයවැය හිගය අඩුවීම
- රාජ්‍ය ණය අඩුවීම
- උද්ධමන බලපෑම් අඩුවීම
- ඵලදායීතාවය වැඩිවීම
- විදේශ ණය ලබාගත හැකි වීම
- කාර්යක්ෂම සම්පත් උපයෝජනය
- තාක්ෂණික සංවර්ධනය
- ගෙවුම් ශේෂයට හිතකර වීම

## 12.2.4. සංචාරක කර්මාන්තය

❖ **සංචාරක පැමිණීම් වර්ධනයට බලපෑ හේතූන්**

- ජාත්‍යන්තර සංචාරක සංවිධාන මඟින් ලබාදුන් නිර්දේශ හා සම්මාන
- ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන්.
- සංචාරක කර්මාන්; ;=ළ ආයෝජන කැපී පෙනෙන ෙ,ස ඉහළ යාම
- සේවා සැපයුමෙහි .=ණා;්මක බව ඉහළ යාම
- ගුවන් හා මුහුදු මාර්ග හරහා අනෙකුත් රටවල් සමග සම්බන්ධතාව වැඩිදියුණු වීම

**ශ්‍රී ලංකාව හා සංචාරයේ යෙදෙන විශාල සංචාරක ප්‍රභවයන් පිළිවෙලින් පහත දැක්වේ.**

1) ඉන්දියාව
2) චීනය
3) එක්සත් රාජධානිය
4) ජර්මනිය
5) ඕස්ට්‍රේලියාව



**ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීමේ අරමුණු ලෙස**

- විවේකය ගත කිරීමට
- ව්‍යාපාර කටයුතු
- නෑදෑ මිත්‍රාදීන් මුනගැසීම
- ආගමික හා සංස්කෘතික කටයුතු
- සෞඛ්‍ය අධ්‍ය)පන හා කී්‍රඩ) කටයුතු

**ශ්‍රී ලංකාව තුළ සංචාරක ප්‍රවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග සහ වැඩසටහන්**

1) වසරේදී හඳුන්වාදුන් 2017-2020 සඳහා නව සංචාරක උපායමාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීම 2018 වසරේදීත් අඛණ්ඩව ක්‍රියාත්මක විය.
2) සංචාරක සල්පිල් පැවැත්වීම.
3) ප්‍රචාරණ වැඩසටහන්
4) CNN වැනි පිළිගත් ජාත්‍යන්තර මාධ්‍ය ආයතන තුළ සිදු කළ ප්‍රචාරණ වැඩසටහන්.
5) අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන කටයුතු.
6) සංචාරයන් සඳහා සුහදශීලි ත්‍රීරෝදරථ හඳුන්වාදීම.
7) නව ජීවිතාරක්ෂක ඒකක පිහිටුවීම.
8) ජංගම සංචාරක පොලිස් කොට්ඨාස පිහිටුවීම.

❖ 2018 වසරේදී සංචාරක ක්ෂේත්‍ර සඳහා වූ ආයෝජන පුළුල් විය. එසේම සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යාම තුළින් සංචාරක ඉපයීම් වල වර්ධනයක්ද සිදු විය. **නමුත් ගෝලීය සංචාරක වෙළඳ පළ තුළ ශ්‍රී ලංකාවේ විභවතාව තවමත් ළඟා කරගෙන නොමැත.**

## සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග

- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- උසස් කාර්යක්ෂම පොදු ප්‍රවාහන පහසුකම් මුළු රටම ආවරණය වන පරිදි සැකසීම.
- රජය හා සංචාරක ව්‍යාපාරයේ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ගොඩ නැගීම.

## 12.2.4 සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා විශ්ලේෂණය කරයි.

- 2018 වසරේදී සංචාරක පැමිණීම් වල වර්ධනයක් දක්නට ලැබුණි.
- 2019 වසරේදීත් සංචාරය කළ හැකි හොඳම ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ලෝන්ලි ප්ලැනට් (Lonely Planet) සහ නැෂනල් ජියෝග්‍රෆික් (National Geographic) ඇතුළු ආයතන මගින් නිර්දේශ කරන ලදී.
- වසරක් තුලදී වූ ඉහළම වාර්ෂික සංචාරක පැමිණීම වාර්තා කරමින් 2018 සංචාරක පැමිණීම 10.3% කින් වර්ධනය විය.
- ශ්‍රී ලංකාව හා සංචාරයේ යෙදෙන විශාලතම සංචාරක ප්‍රභවය ඉන්දියාව වේ.

## 12.2.5. ප්‍රාදේශීය සංවර්ධනය

❒ **ප්‍රාදේශීය සංවර්ධනය යනු**

- ප්‍රාදේශීය සංවර්ධනය රටක සංවර්ධන ක්‍රියාවලියේ දී බහුලව හා නිරන්තරයෙන් භාවිතා වන යෙදුමකි. එමගින් අර්ථ ගැන්වෙන්නේ"අඩු ආර්ථික සංවර්ධනයක් සහිත ප්‍රදේශ සඳහා සහය ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ගය."
- ප්‍රාදේශීය සීමාවන් එම සහය ක්‍රියාමාර්ගයන් ගේ භාවිතයන් හා ඉලක්ක එකිනෙකට වෙනස් වේ. මේ අනුව, ප්‍රාදේශීය සංවර්ධනය යන ඉතා පුළුල් යෙදුමක් බව පෙනෙන්නට ඇතත් සරල අර්ථයෙන් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් එය ප්‍රාදේශීයව පවත්නා විශමතාවන් අවම කිරීම සඳහා රැකියා හා වත්කම් ජනනය කිරීම සඳහා ගනු ලබන පොදු උත්සහයක් වශයෙන් හඳුන්වනු ලැබේ.

## ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන

- අගනුවර සහ ඉන් බැහැර ප්‍රදේශ අතර යටිතල පහසුකම් සැපයීමේ විෂමතාමයක් පැවතීම රට තුළ කර්මාන්ත සංවර්ධනය කිරීමට ඇති එක් ප්‍රධාන බාධාවකි.
- අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන එක් ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස **"ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන"** වැඩසටහන දැක්විය හැක.
- මෙම වැඩසටහන යටතේ බස්නාහිර පළාත තුළ ඒකරාශීවී තිබූ කර්මාන්ත දිවයින පුරා කර්මාන්තපුර 26 ක් සංවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීම සිදුකර ඇත.

- ග්‍රාමීය ප්‍රදේශවල ඇති සුදුසු ඉඩම් හඳුනාගෙන කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත පිහිටුවීමට අවශ්‍ය මාර්ග, විදුලිය, ජලය ආදී මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම වැඩසටහන යටතේ කරනු ලබයි.
- 2012 වසර අවසාන වන විට මෙම වැඩසටහන යටතේ කර්මාන්ත 277 ක් ඔවුන්ගේ කර්මාන්තායතනවල වාණිජ නිෂ්පාදන අරඹා ඇති අතර කර්මාන්ත 48 ක් සිය ඉදිකිරීම් කටයුතුවල නියැලේ.
- මෙම වැඩසටහන මඟින් රැකියා අවස්ථා 15,182 ක් බිහිකර ඇත.

- බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති මතුගම කර්මාන්තපුරයට අයත් ෂ වන අදියරයේ සංවර්ධන කටයුතු 2007 වර්ෂයේ ආරම්භ කල අතර 2010 ඔක්තෝම්බර් අවසාන වන විට එහි යටිතල පහසුකම් සියල්ලක්ම සපයා අවසන්ය.

- මෙම කර්මාන්තපුරයේම අදියර ෂෂ හි සංවර්ධන කටයුතු 2011 වර්ෂයේ ආරම්භ කල අතර 2014 වර්ෂයේදී එහි වැඩ කටයුතු නිම කිරීමට අපේක්ෂාකර තිබුණි.



## ප්‍රාදේශීය සංවර්ධනයේ වැදගත්කම

- යටිතල පහසුකම් සංවර්ධනය වීම
- සේවා නියුක්තිය ඉහළ යාම
- දේශීය නිශ්පාදිතය ඉහළ යාම.
- මිනිසුන්ගේ ජීවන තත්වය ඉහළ යාම.
- නවෝත්පාදන දිරිමත් වීම.
- ප්‍රාදේශීය සංවර්ධන විශමතා අවම වීම.
- කුඩා කර්මාන්ත දිරිමත් වීම.
- ව්‍යාසායකයන් දිරිමත් වීම.

## ආර්ථිකයේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාධක

- රාජ්‍ය නිලධාරීවාදය.
- දේශපාලන පක්ශපාතීත්වය.
- දේශපාලන අස්ථාවරත්වය.
- දියුණු තාක්ෂණික ක්‍රම භාවිතා නොකිරීම.
- වෘත්තීමය දැනුම හා පුහුණුව ලබා ගැනීමට ඇති අවස්ථා දුලබ වීම.

## 12.3 සමකාලීන ආර්ථික සිදුවීම් සහ ප්‍රතිපත්ති



## 12.3.1. මෑතකාලීන වශයෙන් සිදු වූ දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම් (නිදසුන්)

### ශ්‍රී ලංකා ආර්ථියට බලපෑ දේශීය සිදුවීම්

- 2019 වසරේ පළමු භාගයේ දී, පාස්කු ඉරුදින ප්‍රහාර වල බලපෑමද ඇතුළුව මූලික වශයෙන් දේශීයව පැන නැගුණ අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.

**පළමු මාස 6 තුල ආර්ථික වර්ධනය %**

| | | |
|---|---|---|
| 2018 | 3.9 | • විරැකියා තත්ත්වය ඉහළයාම. මීට හේතුවක් වශයෙන් මන්දගාමී ආර්ථික වර්ධනය ද බලපෑම් ඇති කරන ලදී. |
| 2019 | 2.6 | |

**විරැකියා අනුපාතය ඉහළයාමට බලපාන සාධක**

- අවුෘ 20-29 කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 14,8% ක් වැනි ඉහළ මට්ටමක පැවතීම.
- අ.පො.ස.උ.පෙළ හා ඊට ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සහිත කාන්තාටන් අතර සේවා වියුක්තිය 12.3%ක ඉහළ මට්ටමක පැවතීම.
- ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයන් කෙරේ පළමු භාගය තුළ 2018 වර්ෂයට සාපේක්ෂව ඉහළයාම.
  2018-51.5%
  2019-52.6%
- පුරුෂ හා ස්ත්‍රි ලෙස සහභාගිත්ව අනුපාතික 73.4% ක් හා 34.8% ක් වීම.
- 2019 වසරේ පළමු භාගයේදී සමස්ථ සේවා නියුක්ත ජනගහනයෙන් 28.3%ක් කර්මාන්ත අංශයෙන්ද 47.3ක් සේවා අංශයෙන්ද රැකියාවල නිරත වීම.
- කෘෂිකාර්මික අංශයේ නියුතු ශ්‍රම බලකාය වසරේ පළමු භාගය තුළ 2018 වසරේ පැවති 25.5% සිට 24.5% දක්වා පහළ ගියේය.

**ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යාමට හේතු**

- වෘත්තීය ආරක්ෂාව පිළිබඳ ගැටලු පැවතීම
- වෘත්තීය පුහුණුව නොමැති වීම
- කාන්තාවන් වෙහෙස අඩු රැකියා අපේක්ෂා කිරීම
- වැටුප් හා උසස්වීම් සම්බන්ධ ස්ත්‍රී පුරුෂ විෂතාවයන් පැවතීම
- පොදු ප්‍රවාහනයේදී සිදුවන හිංසන
- යල්පැන ගිය සමාජ සම්මත (උදාඃ කාන්තාව නිවසට වී තම දරුවන් රැක බලාගැනීම)

**උගත් සේවා වියුක්තියට බලපාන හේතු**

- රජයේ රැකියා අපේක්ෂා කිරීම
- පහසු රැකියා අපේක්ෂා කිරීම
- ඉහළ වැටුප් අපේක්ෂා කිරීම
- වෘත්තීය හැරයනු ඇතැයි දරන මතය නිසා රැකියා අවස්ථා නොලැබී යාම
- ශ්‍රම වෙළඳපොළ තුල පවතින දැඩි තරගකාරීත්වය
- උසස් අධ්‍යාපන අවස්ථා බහුල වීම (උදා: රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාල)

**තරුණ විරැකියා අනුපාතය ඉහළ යාමට හේතු**

- භාෂා හැකියාව ප්‍රමාණවත් නොවීම
- වෘත්තීය පුහුණුව නොමැති වීම
- පහසු රැකියා අපේක්ෂා කිරීම
- අධ්‍යාපනික අවශ්‍යතා බහුල වීම
- තරුණ පරපුර ශ්‍රමය යොදවන රැකියා වෙනුවට බුද්ධිය යොදවන රැකියා වලට වැඩි කැමැත්තක් දැක්වීම

## ශ්‍රී ලංකා ආර්ථියට බලපෑ ගෝලීය සිදුවීම්

- ආසියාතික මූල්‍ය අර්බුදය
- යුරෝපා ආර්ථික අර්බුදය
- ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගටම ඇති වූ අර්බුදයන්
- ලෝක ආහාර අර්බුදය
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
- විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව හඳුනාගත හැකිය.

## 12.3.2. දේශීය හා ගෝලීය සිදුවීම් මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට කරන ලද බලපෑම

**පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා සේවා අංශයට සිදු වූ බලපෑම**

| ස්ථාවර මිල යටතේ වර්ධනය | 2019 පළමු කාර්තුව % | 2019 දෙවන කාර්තුව |
|---|---|---|
| **තොග සහ සිල්ලර වෙළඳාම** | 4.4 | 1.3 |
| **ප්‍රවාහන** | 1.8 | (1.5) |
| **නවාතැන්,ආහාර පාන** | 4.5 | (9.9) |

**2019 පළමු භාගයේදී ප්‍රවාහන අංශය මන්දගාමී විය. (%)**

| මාර්ගස්ථ මගී කිලෝමීටර | (5.9) |
|---|---|
| දුම්රිය මගී කිලෝමීටර | (4.4) |
| දුම්රිය භාණ්ඩ කිලෝමීටර | (3.6) |
| සිවිල් ගුවන් මගීන් සංඛ්‍යාව | |
| මුළු ගුවන් මගීන් සංඛ්‍යාව | (19.0) |
| මුළු භාණ්ඩ හැසිරවීම | (8.0) |

## ❒ ශ්‍රී ලංකා ආර්ථිකය හා උද්ධමනය

- වර්ෂයේ පළමු මාස 6 කාලය තුල උද්ධමනය අපේක්ෂිත පරාසය තුළ අඛණ්ඩව පැවතුණි.
- අපේක්ෂිත උද්ධමන පරාසය වනුයේ 4% - 6% වේ. නමුත් ප්‍රධාන වශයෙන් පාරිභෝගික මිල දර්ශකයේ නිවාස කුලී සඳහා යම් කාළසීමාවකට වරක් සිදුකරන ගැළපීම හේතුවෙන් 2017 ජනවාරි මාසයේ සිට මූලික උද්ධමනය ඉහළයාමක් පෙන්නුම් කරන ලදී.

  - ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණය වෙත කඩිනමින් යොමු වෙමින් සිටින අතර උද්ධමනය මැද තනි අගයක මට්ටමේ ස්ථායිව පවත්වා ගැනීමේ අරමුණින් වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ඉදිරි දැක්මක් සහිතව **මුදල් ප්‍රතිපත්තිය** අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.
  - මුදල් සමස්ථයන්ගේ අඩු වර්ධනය යටතේ පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය (වාර්ෂික ලක්ෂමය ) 2018 වර්ෂයේ අවසානයේ 13.9% ක් වූ අතර 2019 අගෝස්තු වන විට 7.7% ක් විය.
  - පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණය වර්ධනයේ පහලයාමක් පෙන්නුම් කරන ලදී.(වාර්ෂික ලක්ෂමය) 2018 වර්ෂය අවසානයේදී එය 15.9% ක් වූ අතර 2019 අගෝස්තු වන විට 7.2% ක් විය.
  - රාජ්‍ය සංස්ථා සඳහා ලබාදුන් ණය (වාර්ෂික ලක්ෂමය ) 2018 වර්ෂය අවසානයේදී 40.7% ක් වූ අතර 2019 අගෝස්තු වන විට 16.8% දක්වා පහළ ගියේය.
  - රජයට ලබාදුන් ශුද්ධ ණය (වාර්ෂික ලක්ෂමය ) 2018 වර්ෂය අවසානයේදී 16.9% ක් වූ අතර 2019 අගෝස්තු වන විට 21.1% දක්වා පහළ ගියේය.

## 12.3.3.දේශීය හා ගෝලීය ආර්ථික සිදුවීම් කෙරෙහි බලපාන සාධක

**මතුපිට උද්ධමනයේ උච්චාවචනයන් සඳහා බලපාන සාදක**

- මිල සූත්‍ර පාදක කරගත් දේශීය ඉන්ධන මිල ගණන් ඇතුළු පාලිත මිල ගණන් ඉහල දැමීම.
- නිවාස සඳහා කුලී ඉහලයාම
- තීරුබදු සංශෝධන
- 2018 වසරේ අග භාගයේදී රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමේ පසුකාලීන බලපෑම
- ආහාර මිල ගණන් අඩු මට්ටමක පැවතීම
- ආහාර මිල ගණන් නැවත ඉහළයෑම

**ගෝලීය ආර්ථික සිදුවීම් සඳහා බලපාන සාධක**

| ගෝලීය ආර්ථික සිදුවීම | ගෝලීය ආර්ථික සිදුවීම සඳහා බලපෑ සාදක | ශ්‍රී ලංකා ආර්ථිකයට කරන බලපෑම |
|---|---|---|
| **ආසියාතික මූල්‍ය අර්බුදය** | -අග්නිදිග ආසියානු කලාපයේ මූල්‍ය වෙළෙදපොල දැඩි පීඩනයට ලක්වීම<br>-විදේශ ව්‍යවහාර මුදල් ඒකක බොහෝ සේ අවප්‍රමාණය වීම | -ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම<br>- ආසියාතික රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ මිල අධික වීම |
| **යුරෝපා ආර්ථික අර්බුදය** | -2006 වසරේ සිට ඇමරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ අවපාත තත්ත්වය | - ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපල, විදේශ සේවා නියුක්තිය හා විදේශ ආයෝජන පහළ යාම |
| **ලෝක ආහාර අර්බුදය** | -ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් යොදා ගැනීම | -ශ්‍රී ලංකාවට ආනයන කරනු ලැබූ කිරිගු පිටි,කිරි පිටි මිල ඉහල යාම |
| **ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම** | -සීඝ්‍ර කාර්මික විප්ලවය හේතුවෙන් ගෝලීය අවකාශයට මුදා හැරෙන වායූන් ප්‍රමාණය ඉහළ යාම | - සාගර සම්පත් විනාශ වී යාම<br>- බෝග ඵලදාව අඩුවීම |

## 12.3.4. සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති

- 2019 අයවැය වාර්තාව 2019 මාර්තු 5 වන දින "**ජනතාවට ශක්තිය .දුප්පතුන්ට රැකවරණය, එන්ට්‍රප්‍රයිස් ශ්‍රී ලංකා**" තේමාව යටතේ හිටපු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලදී.
- මේ යටතේ ආදායම් යෝජනා රාශියක් ද ඉදිරිපත් කරන ලදී

**ආදායම් ප්‍රවර්ධන යෝජනා:** 2019 අයවැය වාර්තාව

| යෝජනාව | වර්ෂයකට රු.මි. |
|---|---|
| මෝටර් වාහන සඳහා නිෂ්පාදන බදු සංශෝධනය කිරීම හා සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. | 48,000 |
| ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලද ව්‍යවසායන් විසින් දේශීය වෙළෙඳපල වෙත නිමි ඇදුම් සැපයීමේදී අයකරනු ලබන vat බද්ද සංශෝධනය කිරීම. | 500 |
| සිගරට්,අරක්කු හා තෝරාගත් භාණ්ඩ සඳහා නිෂ්පාන බදු සංශෝධනය කිරීම. | 37,000 |
| විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු හා ආගමන බදු සංශෝධනය කිරීම. | 8,000 |
| බීඩි කොළ සඳහා වූ සෙස් බදු සංශෝධනය කිරීම. | 2,000 |
| තෝරාගත් භාණ්ඩ සඳහා ආර්ථික සේවා ගාස්තුවක් නියම කිරීම | 15,000 |
| දුම්කොල,අරක්කු සහ තෝරාගත් භාණ්ඩ සඳහා රේගු ආනයන බදු සංශෝධනය කිරීම. | 20,000 |

- 2019 අයවැය මගින් පහත අංශ කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් ප්‍රතිපාදන වෙන්කර ඇත.

1) අධ්‍යාපනය
2) සෞඛ්‍යය
3) ජීවනෝපාය සංවර්ධනය
4) නගර සැළසුම්
5) රාජ්‍ය සේවා
6) විදේශ අංශයේ උපනතිය
7) නිවාස සහ ඉදිකිරීම්
8) උරුමය හා සංස්කෘතිය
9) නීති ප්‍රතිසංස්කරණය
10) ආර්ථික සහජීවනය
11) ක්‍රීඩා
12) ගමනාගමන

**වියදම් යෝජනා :** 2019 අයවැය වාර්තාව

| **යෝජනා** | රු,මිලියන |
|---|---|
| – අඛණ්ඩ ගුරු වෘත්තිමය සංවර්ධනය | 100 |
| – ශිෂ්‍යත්ව ලබාදීම සදහා වූ අධ්‍යාපන විශිෂ්ඨත්ව අරමුදලට දායකත්වය | 500 |
| – සුවසැරිය ගිලන්රථ සේවාව සදහා මූලික ස්ථානය | 200 |
| – නිවෙස්වලට ගොස් නින්ගත වකුගඩු රෝග මුල් අවධියේදී හඳුනා ගැනීම | 50 |
| – ගොවීන් සදහා කෘෂි ව්‍යාපාර සහය යෝජනා ක්‍රමය | 250 |
| – සුඛිතපුර නගර සංවර්ධන වැඩසටහන | 2000 |
| – විශ්‍රාම වැටුප් සංශෝධනය | 12000 |
| – ව්‍යවසාය නවෝත්පාදන වැඩසටහන | 50 |
| – ජාතික කලාභවන නවීකරණය | 100 |
| – ජාතික ඔලිම්පික් අරමුදලට දායකත්වය | 100 |

## සහස්‍ර අභියෝගතා සමායතනය(MCC- Millennium Challenge Corporation)

- ඌණ සංවර්ධන රටවල දිළිදුකම පිටු දැකීම හා ආර්ථික වෘද්ධිය ඉදිරියේ ඇති සංරෝධක ඉවත්කිරීම උදෙසා ඇ.එ.ජ.යේ මූල්‍යාධාර පිරිනැමීම වෙනුවෙන් ඇ.එ.ජනපදයේ 2003 සහස්‍ර අභියෝගතා පනතින් ස්ථාපිත වූ ආයතනයකි.

සහශ්‍රක අභියෝගතා ගිවිසුම (MCC ගිවිසුම) හරහා මූලිකවම පස් අවුරුදු කාලයක් සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍යාධාර ලබාදෙනු ලබන අතර,

- ප්‍රවාහන ක්ෂේත්‍රය,
- කෘෂිකාර්මාන්තය හා ඉඩම්,
- බලශක්ති හා ජල කළමනාකරණය

යන ඉසව් වෙත අවධානය යොමු කරනු ලබයි.

මෙහිදී මූල්‍ය ආධාර ලබාදීමට රාජ්‍යයන් තෝරාගැනීමේ දී දේශපාලනික, ආර්ථික සහ සාමාජීය නිර්ණායක 17ක් පිළිබඳ MCC ආයතනය විසින් සලකාබලනු ලබයි. එනම්,

i. සිවිල් නිදහස තහවුරු කිරිම
ii. දේශපාලන අයිතිවාසිකම්
iii. පාරදෘශ්‍යතාවය සහ වගවීම
iv. රාජ්‍ය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම
v. නීතියේ ආධිපත්‍යය තහවුරු කිරිම
vi. දූෂණය පාලනය කිරීම
vii. ජනතාවගේ ප්‍රතිශක්තිකරණ මට්ටම ඉහළ නැංවීම
viii. සෞඛ්‍ය සඳහා දරන වියදම් ඉහළ නැංවීම
ix. දැරියන් විසින් ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම,
x. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දරන රාජ්‍ය වියදම,
xi. ස්වභාවික සම්පත් කළමනාකරණය,
xii. වෙළඳ ප්‍රතිපත්තිය,
xiii. උද්ධමන මට්ටම පාලනය කිරීම,
xiv. දේපල/ඉඩම් අයිතිය සහ අත්පත්කරගැනීමේ සංඛ්‍යාලේඛණ සකස් කිරීම
xv. ආර්ථික කළමනාකරණය/ පරිපාලන තත්ත්වය,
xvi. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය විධිමත් කිරීම,
xvii. පහසුවෙන් ව්‍යාපාර ආරම්භ කිරීමේ ඉඩප්‍රස්තාවන් ඉහළ නැංවීම

MCC ගිවිසුම හරහා ආධාරයක් ලෙස (නැවත අය කර ගනු නොලබන) ඇමෙරිකානු ඩොලර් මිලියන 480ක් (ශ්‍රී ලංකා රුපියල් බිලියන 85ක්) ශ්‍රී ලංකාවට ලැබාදීමට නියමිතව තිබුණි.

### MCC ගිවිසුම හරහා ශ්‍රී ලංකාවට ඇතිවිය හැකි බලපෑම කුමක්ද?

ගිවිසුම අනුව, ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත ඇමරිකානු ඩොලර් මිලියන 480 න් ඩොලර් මිලියන 447.5 උපයෝජනය කල යුතු වන්නේ, **'ඉඩම් ප්‍රතිසංස්කරණය'** සහ **'ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය'** යන මූලික ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් ය.

ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය හරහා මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම අරමුණු කර ඇති අතර, මේ යටතේ

(i) මධ්‍යම වටරවුම් මාර්ග ජාලයට (Central Ring Road Network) ඇතුළත් ප්‍රදේශවල මාර්ග නවීකරණය කිරීම,

(ii) මාර්ග තදබදය කළමනාකරණය කිරීම (Advanced Traffic management System),

(iii) පොදු බස් රථ සේවාව නවීකරණය කිරීම (Bus Transport Service Modernization) යන මූලික ප්‍රතිඵල අත්පත්කරගැනීමට ඉලක්කගතකර ඇත.

- ගිවිසුම් ගත ව්‍යාපෘතිය තුළ පාරිසරික තිරසරභාවය වෙත අඩු අවධානයක් යොමුකර තිබීම ප්‍රධානතම ගැටලුවකි. ඒ අනුව, ව්‍යාපෘතිය යටතේ යෝජිත මධ්‍යම වටරවුම් මාර්ග ජාලය (Central Ring Road Network) නිර්මාණය කිරීම පාරිසරික වශයෙන් අයහපත් බලපෑම් ඇති කිරීමට නියමිත බව පරිසර වේදීන්ගේ මතයයි. මෙම මාර්ග ජාලය මෙරට මධ්‍යම කඳුකරය ආශ්‍රිත පාරිසරික සංවේදී කලාප හරහා නිර්මාණය කිරීමට යෝජිතය.
- MCC ගිවිසුම යටතේ වඩාත් වැඩි අවධානයක් යොමු වී ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හරහා තෝරාගත් දිස්ත්‍රික්ක 12ක රජයට අයත් සහ අයිතිකරුවන් සහිත ඉඩම් මැන; නිසි ඔප්පුවක් නොමැතිව බලපත්‍ර මගින් ඉඩම් අයිතිය ලබාගෙන සිටින පුද්ගලයින්ට නිසි ඔප්පු ලබා දීමත්, ඉඩම් ඔප්පු ඩිජිටල්කරණය හරහා වාර්තා පවත්වාගෙන යාම අපේක්ෂිතය.
- මෙරට සුළු හා මධ්‍යපරිමාණ ගොවීන්ගෙන් 60%ට අධික පිරිසක් වගා කරනු ලබන්නේ බලපත්‍ර සහිත රජයේ ඉඩම් තුළය. ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥාපනතේ විධිවිධාන අනුව රජය මගින් පිරිනමන ඔප්පු (ස්වර්ණභූමි, ජයභූමි ආදී) යටතේ බුක්ති විඳින ඉඩමක් රජයේ නිසි අවසරයකින් තොරව විකිණීමේ හැකියාවක් ඉඩමේ බුක්තිය දරන්නාට නොලැබේ. එහෙත් ඒ තත්ත්වය දේපල බුක්ති විඳීමට හෝ අනුප්‍රාප්තියට කිසිදු බාධාවක් නොවේ. මේ තත්ත්වය ගොවි ජනතාව සතු ඉඩම් සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කිරීමට හේතු වී ඇත.
- යෝජිත MCC ගිවිසුම යටතේ මෙරට රජයේ ඉඩම් සඳහා පුද්ගලයන් වෙත පරම අයිතිය හිමිවන පෞද්ගලික දේපල හිමිකාරිත්වයක් ඇති කිරීමට නියමිතය. ඒ අනුව සෑම ඉඩම් හිමියකුටම ස්වකීය ඉඩමේ පෞද්ගලික හිමිකාරිත්වය තහවුරු වන ආකාරයේ ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීමත් එමගින් එම ඉඩම් විකිණීමේ උකස් කිරීමේ හැකියාව නිර්මාණය කිරීමත් අරමුණු කර ඇත.
- උක්ත යෝජනාවලිය හරහා රජයේ ඉඩම් බුක්ති විඳින තැනැත්තන් වෙත පෞද්ගලික ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම තුළ එම දේපල පෞද්ගලික දේපල බවට පත්වන අතර, එකී දේපල විකිණීමට හෝ උකස් කිරීම එතෙක් පැවති නෛතික බාධාව ඉන් ඉවත් වනු ඇති අතර එමගින් මෙරට කෘෂි ඉඩම් ද බහුජාතික සමාගම් වෙත මිලදීගැනීමේ හැකියාව නිර්මාණය වනු ඇත.


### MCC ආධාර මගින් ශ්‍රී ලංකාවට ලැබෙන වාසි

- බස්නාහිර පළාතේ දැනට පවතින වාහන තදබදය ලිහිල් කිරීම.
- ගමන් පහසුව මගින් ජනයාට වඩාත් ඵලදායී ලෙෂ ආර්ථික වර්ධනයට දායක වීමට හැකියාව ලැබීම.
- වෙළෙඳපොලට ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය.
- ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාවට තම නිෂ්පාදන පහසුවෙන් අලෙවිකරගැනීමට හැකිවීම.
- ඊ-ප්‍රවේශපත්‍ර මගින් බස් ගාස්තු එකතුකර ගැනීමට පහසු වීම.
- ඊ-ඉඩම් ඔප්පු හේතුවෙන් ඉඩම් හිමියන්ට තම ඔප්පු ආරක්ෂිතව තබා ගැනීමට පහසු වීම හා බැංකු ණය අයදුම් කිරීමේදී පහසු වීම.

### MCC ආධාර මගින් ශ්‍රී ලංකාවට ඇති අවාසි

- ජාතික ආරක්ෂාව වෙනුවෙන් හෝ වෙනත් උපායමාර්ගික වැදගත්කමක් වෙනුවෙන් රජය භාරයේ පමණක් තිබිය යුතු ඉඩම් තොරතුරු එක්ස ආයතනය සතු වීම.
- බලපත්‍ර යටතේ ගොවීන් විසින් භුක්ති විදිනු ලබන වගා ඉඩම් වලට සින්නක්කර ඔප්පු ප්‍රධානය ඉඩම් අහිමි ගොවි පරපුරක් නිර්මාණය කෙරෙන මූලික පියවරක් වීම.
- ජාතික ආරක්ෂාව හා ස්වෛරීත්වයට තිබිය හැකි අවධානම.
- පොදු ප්‍රවාහන මාධ්‍යයක් වූ දුම්රිය පද්ධතිය පිළිබඳ අවධානය යොමු නොවීම.





## ❒ කලාපීය වෙළඳ ගිවිසුම්

### සප්තා

- 1995 දී ඇතිකරගත් එකගතාවයකි.
- සාක් කලාපීය රටවල තීරු බදු හා තීරු බදු නොවන වෙළඳ බාධක ඉවත් කිරීම තුලින් වෙළඳ හා ආර්ථික සහයෝගීතාවය පුළුල් කිරීම අරමුණු කරගෙන සිටී .
- ප්‍රභවස්ථාන නීති (Rules of origin) ලැයිස්තුව මේ සඳහා බාධා වී ඇත




### සෆ්ටා (South Asian Free Trade Agreement)

- 2006 වර්ෂයේ දී අත්සන් කළ එකගතාවයකි.
- සෆ්ටා වලට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක් ඇතුලත් වනු ඇත.
- කලාපයේ සංවර්ධනය වන රටවල් අවුරුදු හයක් තුළ දී තීරුබදු 0% - 5% ත අතර ප්‍රමාණයකට අඩු කිරීමටත්, ඌන සංවර්ධිත රටවල් අවුරුදු 10 කින් තීරුබදු එම මට්ටමට ගෙන ඒමත් එකඟ වී ඇත.




### බිම්ස්ටෙක් නිදහස් වෙළෙඳ ගිවිසුම

- 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.
- බෙංගාල බොක්ක ආශ්‍රිත සාමාජික රටවල් වලින් සමන්විත වේ.
  - ✓ උදා: බංග්ලාදේශය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, භූතානය, ශ්‍රී ලංකාව හා තායිලන්තය
- විශේෂයෙන් අවධානය යොමුකර ඇති ක්ෂේත්‍ර
  - ✓ උදා: වෙළඳාම හා ආයෝජනය, තාක්ෂණය, බලශක්තිය,ජලජ සම්පත්, සංචාරක කර්මාන්තය, ප්‍රවාහනය හා සන්නිවේදනය




### ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම

- 2005 ආරම්භ කළ සංවිධානයකි.
  - ✓ සාමාජිකයන් වන්නේ, උදා: බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, චීනය, පිලිපීනය, දකුණු කොරියාව

## තීරයක් සහ මාවතක් ව්‍යාපෘතිය

- තීරයක් හා මාවතක් ව්‍යාපෘතිය **චීනය** මගින් ක්‍රියාත්මක කරනු ලබයිග ගොඩබිමෙන් හා සාගරයෙන් චීනය යුරෝපයට සම්බන්ධ කෙරුණු වෙළඳ මාර්ගය වූ ඓතිහාසික සේද මාවත යළි ප්‍රතිනිර්මාණය කිරීමට චීනය විසින් ගනු ලැබූ ප්‍රයත්නයකි.

## ශ්‍රී ලංකාව වෙත ගම්‍ය වන ආර්ථික බලපෑම්

- ඓතිහාසික අවධියේ පටන් ශ්‍රී ලංකාව සමුද්‍රීය සේද මාවතේ වැදගත් ස්ථානයක් හිමි කරගෙන සිටින අතර මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ආයෝජනය, සංචාරක ව්‍යාපාරය වෙළදාම මත බලපෑම් ඇතිකරනු ඇත.
- තීරයක් හා මාවතක් ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රජය විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති දෙකක් සංවර්ධනය කරනු ලබයි. එනම් **හම්බන්තොට වරාය ආශ්‍රිතව ආර්ථික කලාපයක්** සංවර්ධනය කෙරෙන අතර **කොළඹ වරාය නගරය ආශ්‍රිතව මූල්‍ය හා වාණිජ කටයුතු වර්ධනය** කිරීමට අපේක්ෂා කෙරේ.




- හම්බන්තොට වරාය ආශ්‍රිත කාර්මික කලාපයට විශාල ආයෝජනයක් චීනයෙන් අපේක්ෂා කරන අතර එමඟින් සේවා නියුක්තිය, රාජ්‍ය බදු ආදායම, ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ වලට ප්‍රතිලාභ සැලසීම.

- මෙම ව්‍යාපෘතියේ විවිධ අදියරයන්හි ඉදිකිරීම් සඳහා සහ යටිතල පහසුකම් සැපයීමට ශ්‍රී ලංකාවේ සමාගම් වලට සහභාගි වීමට අවස්ථාව උදාවෙනු ඇත.




- ගෝලීය වටිනාකම් ජාලයට සම්බන්ධ වීමට හැකි වීම. සමුද්‍රීය සම්පත් ගවේෂණය, තාක්ෂණය හා දැනුම් හුවමාරුව, රැකියා උත්පාදනය වැනි අංශ වර්ධනය වීම.

- 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රමාණය ඉහළ යාම හරහා සංචාරක ව්‍යාපාරය වර්ධනය වීම.